# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 77 — 1973 සැප්තැම්බර් 14 වැනි සිකුරාද — 1973.09.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු — ඇබෑර්තු ... ... ... ... | 1191 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1219 |



සැළකිය යුතුයි.—යුක්තිය පසිඳලීමේ පනත් කෙටුම්පත 1973 සැප්තැම්බර් 07 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

## තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරවනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළ වන පොදු කොන්දේසි

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනෙක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්. රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන් ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

**2. දීමනා**

2 : 1 ඒ ඒ තනතුරට අදළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප් වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50ක් විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි : සාමාන්‍ය**

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නියෝග කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසි වලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකි වූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත්, එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 : වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත් වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේ ය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේ දී සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4 සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේ ය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූ ද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ක් දක්වා වූ ස්වේච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්වද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන් ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතු නම්ද ඔවුන්ගේ එම සේවය සතුටු දායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස් වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමතමන් සේවය කළ කාලයන් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තානතුරට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් වකර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරාගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සැලසුම්කරු තනතුර**

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ II පන්තියේ සැලසුම්කරු තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කර ගත් ඉල්ලුම් පත් 1973 ඔක්තෝබර් මස 15 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

**2. වැටුප් පරිමාණය.**—ඒකාබද්ධ : රු. 3,576—20×144—රු. 6,456 කල්පිත : රු. 1,380—20×120—රු. 3,780.

**3. වයස් සීමාව.**—අවුරුදු 25 සිට 35 දක්වාය. රජයේ සේවයේ නියුක්ත වූවන්ට ඉහළ වයස් සීමාව බලපාන්නේ නැත.

**4. සේවයට බඳවා ගැනීමේ නියමයන්.**—මෙම තනතුර ස්ථිර සහ විශ්‍රම වැටුප් රහිතය. තෝරා ගත් අයදුම්කරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුයි.

5. අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :

(i) මූලික ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් අධ්‍යාපන සුදුසුකමක් තිබිය යුතුය. නැතහොත් සිංහල/දෙමළ හා මූලික ගණිතය ඇතුලුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් වී සිටිය යුතුය.

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ එක් අවුරුදු පූර්ණ කාලීන සැලසුම්කරු පාඨමාලාව හෝ සම තත්ත්වයේ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුයි. ඊට අමතරව වර්ෂ දෙකක ආධුනික කාලයක් ද තිබිය යුතුයි.

නැතහොත්

රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක හෝ වරලත් ඉංජිනේරුවකු යටතේ හෝ වරලත් නිර්මාන ශිල්පියෙකු යටතේ හෝ යාන්ත්‍රික ඉංජිනේරු සැලසුම්කරුවෙකු වශයෙන් යටත් පිරිසෙයින් වර්ෂ 5 පළපුරුද්දක් තිබිය යුතුයි.

නැතහොත්

පිළිගත් සැලසුම් කාර්යාලයක හා/හෝ වැඩ පොළක තුන් අවුරුදු ආධුනිකත්ව පුහුණුවක් සමග යාන්ත්‍රික ඉංජිනේරු සැලසුම්කරුවෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 2 ක පළපුරුද්දක් තිබිය යුතුයි.

**සටහන.**—ඉහත සඳහන් සුදුසුකම්වලට අතිරේකව පහත සඳහන් සුදුසුකම් එකක් හෝ ඊට වැඩි ගණනක් ඇති අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(අ) සුලු සැලසුම් වැඩවල සහ යන්ත්‍ර හා යන්ත්‍රාගාර විස්තර පිළිබඳව නිදහස් අත්රූ සටහන් ඇඳීමෙහි ද පළපුරුද්දක්.
(ආ) වර්ෂයක ආධුනික කාලයක් ද ඇතිව ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාවෙන් සමත් වීම.
(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ සන්ධ්‍යා යාන්ත්‍රික ඉංජිනේරු පාඨමාලාවෙන් සමත් වීම.
(ඈ) වෙනයම් පිළිගත් කාර්මික සුදුසුකම්.

6. අයදුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම් පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය
(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපනික සහතික
(ඇ) ආධුනිකත්වය සහ පළපුරුද්ද සනාථ කිරීමට සහතික
(ඈ) චරිතය පිළිබඳව මෑතකදී ලබා ගත් සහතික දෙකක් (දැනට මත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් විසින් චරිත සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ).

7. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ පළවී ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට අදාළ වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

ඒ. සිවගුරු,
සිවිල් පාලක නිලධාරී හා ගණකාධිකාරී,
ගුවන් හමුදා අණ දෙන නිලධාරී වෙනුවට.

1973 සැප්තැම්බර් මස 1 වැනි දින,
මූලස්ථානය,
ශ්‍රී. ලං. ගු. හ.,
තැ. පෙ. 594,
කොළඹ.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සැලසුම්කරු තනතුර

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :
   (i) පෞද්ගලික :————.
   (ii) කාර්යාලයීය :————.
3. උපන් දිනය :————.
4. ජාතිය :————.
5. විවාහකද, අවිවාහද යන වග :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (විභාග සහ සමත්වූ විෂයයන් පිළිබඳ විස්තර අදාළ දින වකවානු සමග සඳහන් කරන්න.)
7. කාර්මික හෝ වෘත්තිය සුදුසුකම් :————.
8. ආධුනිකත්ව පුහුණුව, පළපුරුද්ද ආදිය දින සමග :————.
9. පාසැලෙන් අස්වීමෙන් පසු කළ රැකීරක්ෂා පිළිබඳ විස්තර : ————.
10. ඉදිරිපත් කර ඇති චරිත සහතික ලබාගත් පුද්ගලයින්ගේ නම් සහ තනතුරු :————.

මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගනු ලැබීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දින :————.

9-317—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

අංකය : 11/1/2.

**වාණිජ දෙපාර්තමේන්තුවේ සහකාර වාණිජ අධ්‍යක්ෂ තනතුර**

වාණිජ දෙපාර්තමේන්තුවේ සහකාර වාණිජ අධ්‍යක්ෂ තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්, තැපැල් පෙට්ටිය අංක 560, යුනියන් පෙදෙස, කොළඹ 2 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1973 ඔක්තෝබර් 5 වැනි දින

(ආ) විදේශිය ඉල්ලුම් පත්‍ර : 1973 ඔක්තෝබර් 12 වැනි දින

**සටහන් :**

(i) ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දාවූ ද මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි විදේශයන්හි සිටින ශ්‍රී ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර, විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී බාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් පදනමක් මත වනු ඇත. පත්වීම තුන් අවුරුදු පරිවාස කාල සීමාවකට යටත් වේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය :—

වර්ෂයකට රු. 6,720—360×12,480×11—රු. 16,320. වර්ෂයකට රුපියල් 11,040 ට සහ රුපියල් 14,880 වැටුප් පියවර වලට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත. (1969.10.01 වැනි දිනට පෙර අනුරූප මූලික වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 4,080—360×12 රු. 480×10—රු. 13,200 කි. වර්ෂයකට රුපියල් 8,400ට සහ රු. 11,760ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.)

**සටහන් :**

(අ) තෝරාගනු ලැබූ අයදුම්කරු, වර්ෂයකට රුපියල් 11,040 යේ වැටුප් ලක්ෂ්‍යයට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා යාමට අවශ්‍ය සුදුසුකම විය යුත්තේ, පිළිගත් විශ්ව විද්‍යාලයක අර්ථ ශාස්ත්‍රය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය හෝ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමා උපාධියක් ලැබීම, එසේ නැතහොත් පාඨමාලාවට ඇතුළත් වීමේ සුදුසුකම් වශයෙන් මූලික උපාධියක් පිළිගනු ලබන, ජාත්‍යන්තර සංවිධාන හෝ පිළිගත් ජාත්‍යන්තර ආයතන මගින් සංවිධානය කරන ලද මෙම විෂයයන්ගෙන් යුත් විශේෂඥ පුහුණුව පිළිබඳ පාඨමාලාවක් සම්පූර්ණ කිරීමය.

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව පිළිබඳ එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. උපාධිය ලබාගත් අයදුම්කරුවකු තෝරාගනු ලැබුවහොත්, ඔහු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රුපියල් 7,800ක ආරම්භක වැටුපක තැබීමට සුදුසු වේ.

**විදේශයන්හි සේවය.**—නිලධාරීන් වරින් වර විදේශයෙහි සේවය කිරීම සඳහා පත් කිරීමට ඉඩ ඇති අතර, එසේ පත් කරනු ලබන අවස්ථාවල දී රජය විසින් අනුමත කෙරෙන දීමනාවක් ලැබීමට සුදුසු වනු ඇත.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව

(ආ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව පිළිබඳ පළමුවැනි හෝ දෙවැනි පන්තියේ ගෞරව උපාධියක් හෝ ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව සහිතව පළමුවැනි හෝ දෙවැනි පන්තියේ ගෞරව උපාධියක් දරණ බව, නැතහොත්

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව පිළිබඳ ඇම්. ඇස්. සී. හෝ පී. එච්. ඩී. උපාධියක් තිබිය යුතුය.

(ඇ) 1973 ඔක්තෝබර් මස 5 වැනි දිනට අවුරුදු 35ට වැඩි නොවිය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම වයස් සීමාව බලපාන්නේ නැත.)

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස් විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සළකා බලනු නොලැබේ.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය.

8. අයදුම් පත් හෝ ඒ පිළිබඳ අනෙක් ලියකියවිලි සියල්ලක්ම විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ හෝ වාණිජ දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

10. ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි මෙම කාර්යාලයට ලැබුණු බව ඉල්ලුම් කරුවනට දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍රය භාර ගන්නා දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධිවිධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ජේ. බී. කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 සැප්තැම්බර් 3 දින,
කොළඹ 2, යුනියන් පෙදෙසේ,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ දී ය.
තැ. පෙ. 560.

9-320—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

**කළුතර දිස්ත්‍රික්කයේ මහවිල කොට්ඨාශයේ උප්පැන්න සහ මරණ සහ කළුතර සහ පානදුර තොටමුණ කොට්ඨාශයේ (සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය**

මහවිල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචි වී සිටීම හේතුකොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු විසිඑකකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්‍යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලයෙන්, ග්‍රාම සේවක කාර්‍යාලයයන්, පළාත් පාලන ආයතනයන්, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාලයෙන්, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, සමූපකාර සමිති, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම් වල ඇතුළත්වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්‍යාලයෙන් ලබා ගන්නා ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1973 ඔක්තෝබර් මස 8 වෙනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

ඊ. ඩී. ඩබ්ලිව්. ගුණසේකර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1973 සැප්තැම්බර් මස 1 වෙනි දින,
කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්‍යාලයේ දී ය.
9-241 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**තක්සේරු දෙපාර්තමේන්තුව**

II වන ශ්‍රේණියේ තක්සේරු පරීක්ෂක තනතුරු

තක්සේරු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ පරීක්ෂක තනතුරු සඳහා මෙයින් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කොට 1973 ඔක්තෝබර් 15 වැනි දින හෝ ඊට පෙර මාවෙත ලැබෙනසේ එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය රු. 4,152—144—රු. 6,456 කි. රු. 5,304 වාර්ෂික වැටුප් ලක්ෂයට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය. පත්වීම් ලැබූවන් කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා උසස් කිරීමට පෙර නියමිත පරීක්ෂණයන්ගෙන් සමත් විය යුතුය.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් අහිමිය. මෙම තනතුරට පත් කරනු ලබන්නේ අවුරුදු 3 ක පරීක්ෂක කාලයක් පිටය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක විය යුතුය. දැනටමත් විශ්‍රාම වැටුප් අයිති වාසිකම් සහිත නිලධාරීන්ට දිගටම එහි අයිතිවාසිකම් ලැබෙනු ඇත.

ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කළ යුතුවාක් මෙන්ම, අවශ්‍ය සියලු රාජකාරී ගමන්ද කළයුතුය. රෙගුලාසි අනුව ගමන් වියදම් ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—හැම ඉල්ලුම්කරුවකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව,

(ආ) 1973.10.15 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයෙහි නියුක්තව සිටින අයට මෙම වයස් සීමාව අදාල නොවේ)

(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) පරීක්ෂණයෙන් ගණිතයට සම්මාන සාමාර්ථයක්ද ඇතිව, වාර දෙකකට නොවැඩි ගණනකදී විෂයයන් හයකින් සමත්ව, හෝ ගණිතයෙන් සම්මාන සාමාර්ථයක්ද සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්ව හෝ

(ඈ) ගණිතයෙන් අ.පො.ස. (උ.පෙ.) විෂයයක් වශයෙන් හෝ අ.පො.ස. (සා.පෙ.) සම්මාන සාමාර්ථයක් හෝ සහිතව අ.පො.ස. (උ.පෙ.) විෂයයන් තුනකින් සාමාර්ථය ලබා **තිබීම හෝ**

(ඉ) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව අන් උසස් පරීක්ෂණයකින් සාමාර්ථයක් ලබා තිබීම

සහ

මීට අමතරව පහත සඳහන් සුදුසුකම් වලින් එකක්ද ලබා සිටිය යුතුය :—

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක මධ්‍ය පරීක්ෂණයෙන් සාමාර්ථය **හෝ**

(ආ) ශ්‍රී ලංකා කෘෂිකර්ම පාසලේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ

(ඇ) මැනීම සහ මට්ටම් කිරීම පිළිබඳව සර්වෙයර් ජනරාල්ගේ බලපත්‍රය හෝ

(ඈ) ලංකා කාර්මික විද්‍යාලයේ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හෝ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හෝ අවුරුදු දෙකක් සතුටුදායක ලෙස අවසන් කර තිබීම.

5. ඉල්ලුම්කරු විසින් පහත සඳහන් ලියකියවිලි වල පිටපත් ස්වකීය ඉල්ලුම්පත්‍ර වලට අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය

(**සැ.යු. :** බව්තිස්ම සහතික හෝ උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත්කර ඇති උප්පැන්න සහතික භාරගනු නොලැබේ)

(ii) උසස්ම අධ්‍යාපන සහතිකය හා

(iii) සුදුසුකම්, චරිතය සහ පත්වීම ලැබීමට ඇති යෝග්‍යතාවය පිළිබඳ මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්.

(මෙම පිටපත් ආපසු එවනු නොලැබේ)

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාලවන්නාවූද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

එල්. ඕ. ද සිල්වා,
වැඩබලන ප්‍රධාන තක්සේරුකරු.

තක්සේරු දෙපාර්තමේන්තුව,
ගපූර් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973.08.31 දින.

**තක්සේරු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය**

(**සැ.යු.**—ඉල්ලුම් පත්‍රය බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ ‘II වැනි ශ්‍රේණියේ පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය’ යන පාඨය ලියා එය ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 1, ගපූර් ගොඩනැගිල්ලේ තෙවැනි මහලේ පිහිටි තක්සේරු දෙපාර්තමේන්තුවේ වැඩබලන ප්‍රධාන තක්සේරුකරු වෙත එවිය යුතුය).

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

(ලිපිනයෙහි කිසියම් වෙනසක් වුවහොත් වහාම දන්විය යුතුය)

3. (අ) උපන් දිනය :—.

(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

වර්ෂය :———. මාසය :———. දිනය ———.

(ආ) 1973 ඔක්තෝබර් මස 15 දිනට නියම වයස :—

වර්ෂ :———. මාස :———. දින :———.

(ඇ) උපන් ස්ථානය :————.

4. ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————.

(ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න)

5. විවාහකද, අවිවාහකද ස්වාමියා හෝ බිරිය මියගොස් සිටීද යන වග :————.

6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

7. පහත සඳහන් විෂයයන්ගෙන් සමත් උසස්ම පරීක්ෂණය :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 සිට අධ්‍යාපනය ලැබූ පාසල්, විදුහල් හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය කාර්මික අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාසල/විදුහල | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |

9. පාසලේ හෝ විද්‍යාලයේදී කළ ක්‍රීඩා සහ විෂය මාලාවෙන් බාහිරව කළ කටයුතු ගැන විස්තර :————.

10. පාසලෙන් අස්වූ දින සිට කළ රැකියාව/පුහුණුවීම ගැන විස්තර :————.

11. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංයුක්ත මණ්ඩල යක මීට කලින් රැකියාව කලානම්, එයින් අස්වීමට හේතු :————.

12. ඔබ සාපරාධී වරදකට උසාවියකදී වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

13. වැඩිපුර විස්තර තිබේවක්. වේනම් ඒවා :————.

14. තමා ඉදිරිපත් කරන චරිත සහතික ලබාගෙන තිබෙන තැනැත්තන් තිදෙනාගේ නම්, පදවි හා ලිපිනය :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් මෙයින් ප්‍රකාශ කරමි. මෙහි දක්වා ඇති විස්තර කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය යැයි අනාවරණය වුවහොත් තෝරාගනු ලැබීමට පෙර නම් මා නුසුදුස්සකු වීමට ඉඩ ඇති බවද, පත්කරනු ලැබීමෙන් පසුව නම් කිසිදු වන්දියක් රහිතව මා සේවයෙන් පහ කරනු ලැබීමට ඉඩ ඇති බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

(අපේක්ෂකයා රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

9–267—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

යොමු අංකය : සාප/22/230.

අධ්‍යාපන අමාත්‍යාංශය

වාස්තු විද්‍යාඥ (වාර්ටර්ඩ්) තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අධ්‍යාපන ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාස්තු විද්‍යාඥ (වාර්ටර්ඩ්) තනතුර සඳහා ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව, ඉල්ලුම් පත් පිළියෙල කොට, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත පහත සඳහන් දිනයට ප්‍රථමයෙන් හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාඑවන කවරයේ උඩ වම් කෙළවරේ '' වාස්තු විද්‍යාඥ (වාර්ටර්ඩ්) තනතුර '' යනුවෙන් සඳහන් කළ යුතුය.

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1973.10.15

(ආ) විදේශ ඉල්ලුම් පත්‍ර : 1973.11.1

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල සිටින ලාංකික අයදුම්කරුවන්ට තම ඉල්ලුම් පත්‍ර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවීම සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටට පත්කර සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව තුළදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. වැටුප් පරිමාණය.—

(අ) අවුරුද්දකට රුපියල් 7,800 කින් පටන්ගෙන රුපියල් 360 වාර්ෂික වර්ධක 9ක් හා රුපියල් 480 වාර්ෂික වර්ධක 11 කින් යුතුව රුපියල් 16,320 දක්වා වැඩිවන ඒකාබද්ධ වැටුපක් මේ තනතුරට හිමිවේ. රුපියල් 9,600 රු. 12,000 හා රු. 14,400 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම්ද සහිතය.

(ආ) බ්‍රිතාන්‍ය නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ හෝ රාජකීය ඕස්ට්‍රේලියානු නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ සම්පූර්ණ සංගමිකත්වය හිමිව අවුරුදු 5ක් ගතවී සිටින්නන්ට ආරම්භක ඒකාබද්ධ වැටුප මත එක්වරම වැටුප් වර්ධක 5ක් ඉහළවැටුප් පියවර ලැබීමට හිමිකම් තිබේ.

(ඇ) රු. 9,600 වැටුප් පියවරින් ඔබ්බට යාම සඳහා නිලධාරියෙකු බ්‍රිතාන්‍ය නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ සංගමිකත්වය හෝ රාජකීය ඕස්ට්‍රේලියානු නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ සංගමිකත්වය ලබාගත යුතු වේ.

සටහන.—(1969.10.1 දිනට පෙර මෙම වැටුප් පරිමාණයට අනුරූපව පැවති මූලික වැටුප් පරිමාණය රුපියල් 5,160—9 × 360—10 × 480—රු. 13,200 වේ).

3. සේවයට බඳවා ගැනීමේ නියමයන් හා කොන්දේසි :—

(i) තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයා දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නේ නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා දැනටමත් රජයේ සේවයේ නියුක්ත නැති නම්, මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත්කරනු ඇත. රාජ්‍ය සේවයේ නියැලී ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

(ii) අයදුම්කරුවන් තවදුරටත් සේවයෙහි යෙදවීමට නුසුදුසු බව ආධුනික කාල සීමාව ඇතුළත හැඟී ගියහොත්, දැනටමත් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නෙකු නම්, ආධුනික කාල සීමාව ඇතුළත හෝ එම කාලසීමාව අවසානයේ කලින් දැරූ තනතුරට නැවත පත්කරනු ඇත. ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නෙකු නොවේ නම්, සේවය නතර කරනවා ඇත.

(iii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත් විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ව්‍යවස්ථාවලටද තෝරා පත්කරගනු ලැබූවන් අනුකූල විය යුතුය.

4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ලබා තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළයුතුය:—

(i) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන් සඳහා උපරිම වයස් සීමාව නොයෙදේ).

(ii) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තවීම.

(iii) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :
(අ) බ්‍රිතාන්‍ය නිර්මාණ ශිල්පීන් ගේ රාජකීය ආයතනයේ සංගමිකත්වය ; හෝ
(ආ) රාජකීය ඕස්ට්‍රේලියානු නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ සංගමිකත්වය ; හෝ
(ඇ) බ්‍රිතාන්‍ය නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ හෝ රාජකීය ඕස්ට්‍රේලියානු නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ සංගමිකයන්ගේ අවසාන විභාගයේ I හා II කොටස් සමත්ව තිබීම; හා
(ඉ) නියමිත වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසුව අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්ද.

**අතිරේක සුදුසුකම් :** පාසල් ගොඩනැගිලි සැළසුම් කිරීම හෝ පාසල් ගොඩනැගිලි පර්යේෂණ පිළිබඳ පළපුරුද්දක් ඇති අයට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

5. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතුය. ඉහත i ඡෙදයේ සඳහන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියමිත දිනයට පෙර ලැබී ප්‍රමාදය පිළිබඳව සැලකියයුතු කරුණු ඔහු විසින් ඉදිරිපත් කළහොත් පමණක්, ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වුවද, සෑම අයදුම්කරුවෙකු විසින්ම තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නියමිත දිනට පෙර ලැබෙන පරිදි කෙළින්ම මේ අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පත්වලට අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතික හෝ පාඨශාලාවන්ට ඇතුළත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතික භාරගනු නොලැබේ).
(ආ) අධ්‍යාපන සහතික.
(ඉ) වෘත්තීය/කාර්මික සහතික.
(ඊ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3ක්ද (දැනට රජයේ ස්ථිර සේවයේ සිටින අයදුම් කරුවන් විසින් මේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ).

7. අයදුම්පත් හා ඊට අදාළ වෙනත් ලිපි මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ නිල ලිපිනයට හැර කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි කෙරෙහි ද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය පසුවී දින 14ක් ගෙවුණු කල, අයදුම්පත ලද බවට දන්වීමක් නොලදහොත් ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත වහාම දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාව පැහැර හැරියහොත්, තම අයදුම්පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

1973.09.04 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ, සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දීය.

පී. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අහල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසිවල යකස් කළයුතුය)

අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාස්තු විද්‍යාඥ (වාර්ටර්ඩ්) තනතුරු

1. නම (මුලකුරු සහිතව) :————මහතා/මහත්මිය/මෙනෙවිය.
2. සම්පූර්ණ නම :————.
3. රාජකාරි ලිපිනය :————.
4. පෞද්ගලික ලිපිනය :————.
5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.
   (ආ) එසේ නම්, පරම්පරාවෙන්ද, ලියාපදිංචිවීමෙන්ද ?:————.
6. උපන් දිනය : අවුරුද්ද———, මාසය———, දිනය———.
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස : අවුරුදු———, මාස———, දින———.
8. දැනට දරණ තනතුර පිළිබඳ විස්තර :
   (අ) තනතුර :————.
   (ආ) ස්ථිරද/තාවකාලිකද ?:————.
   (ඉ) විශ්‍රාම වැටුප් සහිතද ? රහිතද ? :————.
   (ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.
   (උ) දෙපාර්තමේන්තුව :————.
   (ඌ) ආයතනය/සේවා ස්ථානය :————.
   (ඔ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.
   (ඕ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.
9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :—

| | විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— |

10. වෘත්තීය/කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :

| | සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|---|
| 1. | ———— | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— | ———— |
| 4. | ———— | ———— | ———— | ———— |
| 5. | ———— | ———— | ———— | ———— |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන :

| | ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|---|
| 1. | ——— | ——— | ——— | ——— |
| 2. | ——— | ——— | ——— | ——— |
| 3. | ——— | ——— | ——— | ——— |
| 4. | ——— | ——— | ——— | ——— |
| 5. | ——— | ——— | ——— | ——— |
| 6. | ——— | ——— | ——— | ——— |
| 7. | ——— | ——— | ——— | ——— |

12. වෘත්තීය/කාර්මික අධ්‍යාපන ලද ආයතන :

| ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|
| ——— | ——— | ——— | ——— |
| ——— | ——— | ——— | ——— |
| ——— | ——— | ——— | ——— |
| ——— | ——— | ——— | ——— |

13. කලින් දැරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළිවෙලට සඳහන් කරන්න) :—

| දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර | ස්ථිරද/තාවකාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| ——— | ——— | ——— | ——— | ——— | ——— |
| ——— | ——— | ——— | ——— | ——— | ——— |
| ——— | ——— | ——— | ——— | ——— | ——— |
| ——— | ——— | ——— | ——— | ——— | ——— |

14. අතිරේක සුදුසුකම් පිළිබඳ විස්තර :

| සේවය කළ ආයතනයේ නම | කරන ලද සේවයේ ස්වභාවය | සේවය කළ කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| ——— | ——— | ——— | ——— |
| ——— | ——— | ——— | ——— |

15. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේ ද? (එසේ නම්, විස්තර දක්වන්න) :————.

16. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේද ? (එසේ නම් විස්තර දක්වන්න) :————.

17. ඔබ මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම් ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

18. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

9-316—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

අංකය : සාප/25/369.

### අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ I වැනි පන්තියේ තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ I වැනි පන්තියේ තනතුරු සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ.

I වැනි පන්තියට ඇතුළත් තනතුරු මේවාය :

(අ) අධ්‍යාපන අධ්‍යක්ෂ I වැනි ශ්‍රේණිය.

(ආ) විභාග කොමසාරිස්.

(ඉ) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්.

මෙහි පහතින් දැක්වෙන ආදර්ශ පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, 1973.10.6 වැනි දිනට හෝ ඊට පෙර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, ලේකම් (අධ්‍යාපන සේවා ඒකකය, සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ '' ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ I වැනි පන්තියේ තනතුරු '' යනුවෙන් සඳහන් කළයුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—** (i) මේ තනතුරු ස්ථිරය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයින් වනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයින්, පත්වීම් ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නේ නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයින්, දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම්, මුල් වතාවේ, තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලි ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාලපරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

(ii) මෙම තනතුරකට පත් කෙරෙන සෑම නිලධාරියකු විසින්ම පත්වීමේ දිනයේ සිට අවුරුදු තුනක් ඇතුළත මෙහි පහත විස්තර කෙරෙන ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමෙන්ද, පත්වීමේ දිනයේ සිට අවුරුදු පහක් ඇතුළත මෙහි පහත විස්තර කෙරෙන දෙවැනි කාර්යක්ෂමතා කඩ ඉමෙන්ද, උත් තීර්ණ විය යුතුය. නියමිත කාලය ඇතුළත කාර්යක්ෂමතා කඩඉම්වලින් උත්තීර්ණ වීමට අසමත්වීම, වැටුප් වර්ධන විලම්බනය කරනු ලැබීමට හේතු වන අතර, ඉඩදී ඇති කාලයට වැඩිපුර ගනු ලබන කාල පරිච්ඡේදය වැටුප් වර්ධන විලම්බනය කරනු ලැබූ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ලැබේ. තවද, කාර්යක්ෂමතා කඩඉම්වලින් උත්තීර්ණ වන තුරු කවර හෝ උසස් තනතුරක් සඳහා ඉල්ලුම් කිරීමට එම නිලධාරීන් නුසුදුස්සන් වනවාද ඇත.

1 වැනි කාර්යක්ෂමතා කඩඉම :

(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග හා ආණ්ඩුවේ රෙගුලාසි ;
(ආ) ගිණුම් ;
(ඉ) අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය ; සහ
(ඊ) දෙවන භාෂාවද ;

ඇතුළත් විභාගයකින් සමත්වීම වේ.

2 වැනි කාර්යක්ෂමතා කඩඉම :

මෙය උත්තීර්ණ වීම සඳහා නිලධාරීන් විසින්, අධ්‍යාපනය පිළිබඳ වෘත්තීය හෝ පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා ගත යුතුය. එය, පිළිගත් විශ්ව විද්‍යාලයක අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ ඊට සමාන වූවක් හෝ අධ්‍යාපනය පිළිබඳ එම්. ඒ. හෝ පී. එච්. ඩී. උපාධිය හෝ විය යුතුය. අධ්‍යාපනය පිළිබඳ (බීඩ්) ප්‍රථම උපාධිය ලබා ඇති අය අධ්‍යාපනය පිළිබඳ වෘත්තීය හෝ පශ්චාත් උපාධි සුදුසුකම ලැබීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ.

සංලක්ෂ්‍යය.— ශ්‍රී ලංකා අධ්‍යාපන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 14 වැනි වගන්තිය අනුව අන්තර්ග්‍රහණය කෙරෙන නිලධාරීන්ට, මෙකී කාර්යක්ෂමතා කඩඉම් නියමයන් සපුරාලීම සඳහා, ලංකා අධ්‍යාපන සේවය වලංගුවූ

දිනය වන 1971.10.15 දින සිට පසු පස් අවුරුදු කාලයක් දෙනු ලැබේ. කෙසේ වුවද, එදින සිට පස් අවුරුදු කාලයක් ඇතුළත ඔවුන් විසින් කාර්යක්ෂමතා කඩඉම් නියමයන් සතුටුදායක අන්දමින් සපුරාලිය යුතුය යන කොන්දේසියට යටත්ව, අස්ථිර උසස්වීම් ලැබීම සඳහා ඔවුන් සුදුස්සන් වනු ඇත. එබඳු අස්ථිර උසස්වීම් ලබා ඇති කිසියම් නිලධාරියකු (ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ I වැනි පන්තියේ නිලධාරීන් හැර) නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් නියමයන් සම්පූර්ණ නොකළ හොත්, වැටුප් වර්ධකය විලම්බනය කරනු ලැබේ. ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ I වැනි පන්තියට අස්ථිර උසස්වීම් හෝ පත්වීම් හෝ ලබන නිලධාරීන් මෙම ඡේදයේ ඉහතින් දක්වා ඇති කාර්යක්ෂමතා කඩඉම් නියමයන් සතුටුදායක අන්දමින් සපුරාලන තෙක් ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ I වැනි පන්තියේ ආරම්භක වැටුප් පියවරෙහිම රැඳෙනු ඇත. (අස්ථිර උසස්වීම් 1976.10.15 දිනට පසුව දෙනු නොලැබේ.)

3. **වැටුප් හා දීමනා :** රුපියල් 18,840 ක වාර්ෂික ඒකාබද්ධ වැටුපකින් පටන්ගෙන රු. 600 ක වාර්ෂික වැටුප් වැඩිවීම් දෙකකින් යුක්තව රු. 20,040 දක්වා වැඩිවන වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරු වලට අයත්ය. වැටුප් වර්ධක ගෙවීම ඉහත 2 ඡේදයේ නියමිත කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීමට යටත්වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම් :** සෑම අයදුම්කරුවකුම පහත දැක්වෙන සුදුසුකම් දරණ බව සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් සහ හොඳ ශාරීරික යහපැවැත්මකින් යුක්ත බව ;
(ආ) පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයක් හෝ සමාන සුදුසුකමක් ඇති බව,
(ඉ) (i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ II වැනි පන්තියේ තනතුරක යටත් පිරිසෙයින් එක් වසරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට ඇත්තාවූද, එම තනතුරෙහි ස්ථිර කරනු ලැබ ඇත්තාවූද, අයකු බව,

නැතහොත්,

(ii) අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ, කවර හෝ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක, (නි. ව. විශ්වවිද්‍යාල බහුතාක්ෂණික ආයතන, ගුරු විද්‍යාල ආදියේ) හෝ වර්ෂයකට රු. 17,640 කට නොඅඩු ඒකාබද්ධ උපරිමයක් ඇති වැටුප් පරිමාණයක් හිමි තනතුරක් දරමින් එම තනතුරෙහි ස්ථිර කරනු ලැබ ඇත්තාවූද, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේදී රු. 14,880 කට නොඅඩු ඒකාබද්ධ වාර්ෂික වැටුපක් ලබමින් සිටින්නාවූද අයකු බව,

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම හෝ අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවකුම සූදානමින් සිටිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසිය යටතේ උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නොලැබේ)
(ආ) උපාධි සහතික හෝ අධ්‍යාපන සහතික
(ඉ) චරිත සහතික දෙකක් : (මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුය.)
(ඊ) වෘත්තීය සහ/ හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික
(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැළකිය යුතුයි.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුයි.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියමිත අවස්ථාවේදී ලැබී, ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට හැර, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට හා අංක 14,979/8 හා 1971.10.12 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවී ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන සේවා ව්‍යවස්ථා සංග්‍රහය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් මෙම කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් 5 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

අංකය :—

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළයුතුය)

අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ 1 වැනි පන්තියේ තනතුරු

1. නම (මුලකුරු සහිතව) : ————. (මහතා/මිය/මෙනෙවිය)
2. සම්පූර්ණ නම : ————.
3. රාජකාරී ලිපිනය : ————.
4. පෞද්ගලික ලිපිනය : ————.
5. (අ) ලාංකිකයෙක් ද යන වග : ————.
**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද.**—ක්‍රීඩා සුදුසුකම්ද සහිතව, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය හෝ ක්‍රීඩා සුදුසුකම් සහිතව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සමාන සුදුසුකම් සමග ආරක්ෂක කටයුතු විෂයෙහි අඩු වශයෙන් අවුරුදු 3 ක වත් පළපුරුද්ද.

අයැදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

රාජ්‍ය ඉස්කාගාර සංස්ථාවේ සභාපති.

රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව,
124, බාන්ස් පෙදෙස,
කොළඹ 7.
1973. 09. 06.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

රාජ්‍ය ඉස්කාගාර සංස්ථාවේ තනතුරක් සඳහා වූ ඉල්ලුම් පත්‍රය

1. ඉල්ලන තනතුර :————.

2. සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය පළමුව සඳහන් කරන්න. මහත්මයෙක්ද, මෙනවියක්ද, මහත්මියක්ද යන වග දක්වන්න).

3. ලිපිනය :————.

4. (අ) උපන් දිනය :—

වර්ෂය :———, මාසය :———, දිනය :———.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :—

වර්ෂය :——, මාසය :——, දිනය :——.

5. (i) ලාංකිකයෙකු වනුයේ :—

(අ) පරම්පරාවෙන්ද ? :————.

(ආ) ලියාපදිංචි කිරීමෙන්ද :————.

(ii) ලියාපදිංචි කිරීමෙන් නම්, ලියාපදිංචි කරන ලද දිනය සහ අංකය :————.

6. ජාතිය :————.

7. විවාහක/අවිවාහක තත්ත්වය :————.

8. (i) ලබා ඇති ඉහළම අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතික නම් කරන්න).

(ii) (අ) සිංහලෙන් ලබා ඇති ප්‍රවීණතාවය—විෂයයන් සඳහන් කරන්න :————.

(ආ) දෙමළෙන් ලබා ඇති ප්‍රවීණතාවය—විෂයයන් සඳහන් කරන්න :————.

(ඉ) ඉංග්‍රීසියෙන් ලබා ඇති ප්‍රවීණතාවය—විෂයයන් සඳහන් කරන්න :————.

9. වෘත්තීය හා කාර්මික සුදුසුකම් :————

10. පළපුරුද්ද.—(ඉල්ලා ඇති තනතුර සඳහා ඔබට ඇති සුදුසුතාවය/අදාල විය හැකි පළපුරුද්ද සැකෙවින් දක්වන්න. ආධුනික කාලය වෙනම දක්වන්න).

11. අදාල තනතුර සඳහා ඇති වෙනත් විශේෂ සුදුසුකම් :————

12. දැනට ඔබ රැකියාවක් කරන්නෙහිද :—එසේ නම්, සේවායයාගේ නම හා ලිපිනය, දරන තනතුර හා වැටුප :————.

13. ඔබ කිසියම් දිනක සාපරාධී වරදකට වරදකරු වී ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

14. ඔබගේ චරිතය හා පැවැත්ම ගැන විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න :—

(i) :————.

(ii) :————.

ඉහත දක්වෙන විස්තර මගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බවත්, මවිසින් දක්විය යුතු විස්තර කිසිවක් සඟවා නොමැති බවත්, මෙයින් ප්‍රකාශ කරමි. රැකියාවට අදාල සාමාන්‍ය කරුණු සහ කොන්දේසි මවිසින් කියවන ලද බවත්, මවිසින් සපයා ඇති කිසියම් විස්තරයක් වැරදි වුවහොත් ඊට ලැබිය යුතු දඬුවම් කවරේද යන්න මං දන්නා බවත්, ප්‍රකාශ කරමි.

ඉල්ලුම්කරුගේ පුරුදු අත්සන.

දිනය :————.

9-401—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ රජයේ සිංහල මාධ්‍ය දුෂ්කර පාසල්වලට සහතික පත්‍ර නොලත් සිංහල උපගුරුවරුන් බඳවා ගැනීම

මෙහි පහත සඳහන් රජයේ සිංහල මාධ්‍ය දුෂ්කර පාසල්වල සහතික පත්‍ර නොලත් සිංහල උපගුරු තනතුරු සඳහා, එම පාසල් පිහිටි ගම්වලම හෝ ඊට ඉතාම ආසන්න ගම්වල ස්ථිර පදිංචිය මෙම නිවේදනයේ 4(ඈ) ඡේදයේ සඳහන් අන්දමට ඔප්පු කළ හැකි, පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ ඊට සමාන සුදුසුකම් ලත් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම අයදුම්කරුවන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. ලේඛනයේ සඳහන් දුෂ්කර පාසල් අතුරින් තමාගේ ස්ථිර පදිංචිය ඔප්පු කළහැකි ගමේ පිහිටි දුෂ්කර පාසල හෝ ඉතාම ආසන්න ගමේ පිහිටි දුෂ්කර පාසල සඳහා පමණක් අයදුම්කරුවෙකුට ඉල්ලුම් කළ හැකි අතර, මෙම නිවේදනය අනුව අයදුම්කරුවකුට **ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම් පත්‍රයක් පමණකි.** මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ පරිදි පිළියෙළ කර ගන්නා ලද අයදුම් පත් පාසල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරි වෙත 1973 ඔක්තෝබර් 31 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''දුෂ්කර පාසල්වල සහතික නොලත් සිංහල උපගුරු තනතුර'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | පාසලේ නම | පාසල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගේ ලිපිනය |
|---|---|---|
| ගාල්ල ... | 1. ගා/පාතවැලිවිටිය වි., උනන්විටිය ... | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගාල්ල |
| | 2. ගා/ලංකාගම වි., මෙදේරිපිටිය | |
| | 3. ගා/වාරුකන්දෙනිය වි., නෙලුව | |
| | 4. ගා/කලුවලගම ක.වි., යක්කලමුල්ල | |
| | 5. ගා/බතෝගල ක. වි., යක්කලමුල්ල | |
| | 6. ගා/උහන්ඕවිට සාසනතිලක ක. වි. | |
| මාතර ... | 1. මාර/අලපලාදෙනිය වි., ඌරුබොක්ක ... ... | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මාතර |
| | 2. මාර/කිරිවලගම ක. වි., දෙනියාය | |
| | 3. මාර/දියදව ක. වි., සියඹලාගොඩ, අකුරැස්ස | |
| | 4. මාර/කෙහෙල්වල ක. වි., බෝපාගොඩ | |
| | 5. මාර/කොහුගොඩ ක. වි., මලිදූව | |
| | 6. මාර/අතපත්තුකන්ද ක. වි., දෙයියන්දර | |
| | 7. මාර/ඇල්ලේවෙල ක. වි., හක්මන | |
| | 8. මාර/කිරිවිලකන්ද ක. වි., ඌරුබොක්ක | |
| | 9. මාර/ගොම්බද්දල ක. වි., ගොමිල-මාවරල | |
| | 10. මාර/දෙන්කන්දලිය ක. වි. රොටුඹ | |
| | 11. මාර/දේවාලෙගම ක. වි., රදවෙල | |
| | 12. මාර/පනාකඩුව ක. වි., රොටුඹ | |
| | 13. මාර/පුවක්ගහහේන ක. වි., ගොමිල-මාවරල | |
| | 14. මාර/බෙල්පාමුල්ල ක. වි., දෙයියන්දර | |
| | 15. මාර/මොලොග්ගමුව ක. වි. මොරගල., කිරිලපනේ | |
| | 16. මාර/විලයාය ක. වි., බෙංගමුව ,ඌරුබොක්ක | |
| | 17. මාර/සපුගහආර ක. වි., හක්මන | |
| | 18. මාර/හුලංකන්ද ක. වි., ඌරුබොක්ක | |
| | 19. මාර/වලකුඹුර ක. වි., දෙනියාය | |
| | 20. මාර/නරවැල්පිට උතුර ක. වි., හක්මන | |
| | 21. මාර/පල්ලාවෙල බටදෙල ක. වි., දෙනගම | |
| තංගල්ල ... | 1. හ/අඟුනකොලවැව වි., තණමල්විල | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, තංගල්ල |
| | 2. හ/රලුව වි., මැදමුලන | |
| | 3. හ/වතුමුල්ල වි., මෝදරවාන | |
| | 4. හ/රිදියගම ජනපද වි., රිදියගම | |
| | 5. හ/උඩමත්තල වි., තිස්සමහාරාමය | |
| | 6. හ/කෙලුල්ල වි., තිස්සමතහාරාමය | |
| | 7. හ/ඉහල කුඹුක්වැව වි., හම්බන්තොට | |
| | 8. හ/හබරත්තවල වි., රිදියගම | |
| | 9. හ/වැලිවැව වි., මීගහජදුර | |
| | 10. හ/අත්තනයාල වි., වීරකැටිය | |
| | 11. හ/අඹකොල වැව වි., කාරියමඩිත්ත | |
| | 12. හ/මාලිගාතැන්න වි., නිහිලුව | |
| | 13. හ/හිඟුරකන්ද වි., කටුවන | |
| | 14. හ/අලුපොත්දෙනිය වි., කටුවන | |
| | 15. හ/උඩගොමඩිය වි., කටුවන | |
| | 16. හ/බෙංගමුකන්ද වි., කටුවන | |
| | 17. හ/ගොමඩිය වි., කටුවන | |
| | 18. හ/විදිකන්ද වි., වලස්මුල්ල | |
| | 19. හ/කිතුල මුල්ලගොඩ වි., ගැටමාන්න | |
| | 20. හ/විගමුව වි., රත්න | |
| රත්නපුර ... | 1. ර/කුඩාව වි., කුඩාව, රත්නපුර ... ... | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, රත්නපුර |
| | 2. ර/නිල්වල වි., ගිලිමලේ | |
| | 3. ර/උතුරු කනේගල්ල ක. වි., ගිලිමලේ | |
| | 4. ර/හැලකඳ ක. වි., ගල්ලෑල්ල | |
| | 5. ර/ඉලුවේකන්ද නව ප්‍රා. වි., පොතුපිටිය, රක්වාන | |
| | 6. ර/කොළඹෑව වි., ගවරපිටිය | |
| | 7. ර/කෝපිකැල්ල ක. වි., කලවාන | |
| | 8. ර/ගෙදගල වි., අයගම | |
| | 9. ර/කුට්ටිකන්ද වි., ඇල්ලගාව | |
| | 10. ර/වැවගම වි., කොක්කාවිට, කලවාන | |
| | 11. ර/හේවායින්කෙන්ද වි., පුවක්පිටිය | |
| | 12. ර/නුගදන්ඩ හද්‍රාවතී වි., ඉංගිරිය | |
| | 13. ර/කලුඅදුර වි., පුවක්පිටිය | |
| | 14. ර/පිටකන්ද වි., එල්ලාවල | |
| | 15. ර/මැදගංඔය වි., වැලිගේපොල | |

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | පාසලේ නම | පාසැල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරියාගේ ලිපිනය |
|---|---|---|
| රත්නපුර | 16. ර/ගල්කන්ද වි., අටකලන්පන්න | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, රත්නපුර |
| | 17. ර/තැන්නහේන වි., ගොඩකවෙල | |
| | 18. ර/හටන්ගල වි., වැලිගෙපොල, බලංගොඩ | |
| | 19. ර/හඳගිරිය වි., බලංගොඩ | |
| | 20. ර/එගොඩවලේබඩ වි., බලංගොඩ | |
| | 21. ර/මෙගොඩවලේබඩ වි., බලංගොඩ | |
| | 22. ර/සුදුහකුරුකන්ද වි., බලංගොඩ | |
| | 23. ර/මැදහින්න වි., පින්නවල | |
| | 24. ර/බුදුන්වෙල වි., හල්පෙ, බලංගොඩ | |
| | 25. ර/උලුපිටිය ක. වි., බලංගොඩ | |
| | 26. ර/ලඳුයාය වි., බෙලිහුල්ඔය | |
| | 27. ර/බටුගම්මන වි., විකිලිය, බලංගොඩ | |
| | 28. ර/වෙලගෙ වි., ඇල්ලෙපොල | |
| | 29. ර/ගවරන්හේන වි., ඇල්ලෙපොල | |
| | 30. ර/දියවින්න වි., රජවක, බලංගොඩ | |
| | 31. ර/දඩයම්කන්ද වි., ඕමල්පේ | |
| | 32. ර/දෙරපනේ වි., ඕමල්පේ | |
| | 33. ර/හේකුන්ගෙගොඩ වි., ගල්වින්න, කහවත්ත | |
| | 34. ර/ඕමල්පේ වි., ඕමල්පේ | |
| | 35. ර/පතහකඩුව වි., කොළඹගේආර | |
| | 36. ර/රංචමඩම වි., කොළඹගේආර | |
| | 37. ර/තෝරකෙලයාය වි., මීද්දෙනිය | |
| | 38. ර/උල්පොත වි., විල්ලෙබැද්ද | |
| | 39. ර/වවුල්පත වි., තල්වින්න, කහවත්ත | |
| | 40. ර/උකුවිපුල්ලිගොඩ වි., පල්ලෙබැද්ද | |
| | 41. ර/තඹගමුව නව වි., පල්ලෙබැද්ද | |
| | 42. ර/මියනකොලදෙනිය හල්වින්න, කහවත්ත | |
| | 43. ර/ආදොලුව වි., කොළඹගේආර | |
| කෑගල්ල | 1. කෑ/අම්පාන ක. වි., කිතුල්ගල | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කෑගල්ල |
| | 2. කෑ/ඉහල උඩුව ක. වි., දේදුගල | |
| | 3. කෑ/නෙලුවක්කන ක. වි., දේදුගල | |
| | 4. කෑ/අකුලඋඩ වි., | |
| | 5. කෑ/කැකලපන වි. | |
| | 6. කෑ/ඌරුවනාව ක. වි., මාලිබොඩ | |
| | 7. කෑ/දික්ඇල්ලකන්ද ක. වි., මාලිබොඩ | |
| | 8. කෑ/පැලෑන ක. වි., කිතුල්ගල | |
| | 9. කෑ/මහයාය ක. වි., මාලිබොඩ | |
| | 19. කෑ/රස්නක්කන්ද ක. වි., දූරනියගල | |
| | 11. කෑ/දෝතලුඔය ක. වි., ගංතුන | |
| | 12. කෑ/යෙලන්වේරිවත්ත ක. වි., අරනායක | |
| මහනුවර | 1. මහ/කැන්නලන්ද ක. වි., මැදමහනුවර | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මහනුවර |
| | 2. මහ/මොරගොල්ල ක. වි., ඉල්ලගොල්ල | |
| | 3. මහ/උඩගලඋඩ ක. වි., ඉල්ලගොල්ල | |
| | 4. මහ/හතුරුකලේක ක. වි., ගෝනගන්තැන්න | |
| | 5. මහ/හීල්පැන්කඳුර ක. වි., උඩවත්ත | |
| | 6. මහ/ගෝනකැලේ ක. වි., මතුරට | |
| | 7. මහ/මාපිල්ල ක. වි., ගෝනගන්තැන්න | |
| | 8. මහ/මීමුරේ ක. වි., මීමුරේ | |
| | 9. මහ/බඹරබැද්ද ක. වි., හුන්නස්ගිරිය | |
| | 10. මහ/ගලමුදුන ක. වි., බටුමුල්ල | |
| | 11. මහ/පල්ලේගලදෙබොක්ක ක. වි., බටුමුල්ල | |
| | 12. මහ/උඩගල දෙබොක්ක ක. වි., බටුමුල්ල | |
| | 13. මහ/පෝප්පිටිය ක. වි., මාඩුගොඩ | |
| | 14. මහ/රන්ටැඹේ ක. වි., අඹගහපැලැස්ස | |
| | 15. මහ/වැව්තැන්න ක. වි., මීනිපේ | |
| | 16. මහ/වැලිගහවාඩිය වි., පල්ලෙවත්ත | |
| | 17. මහ/යටල ක. වි., අලුදෙනිය | |
| | 18. මහ/කොලුවල රේවත ක. වි., උඩහේන්තැන්න | |
| | 19. මහ/කන්දේගම ක. වි., දෙල්තොට | |
| මාතලේ | 1. මා/කාලොගහඇල වි., දඹුල්ල | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මාතලේ |
| | 2. මා/කලුනදූව වි., දඹුල්ල | |
| | 3. මා/වැවල වැව වි., කිඹිස්ස | |
| | 4. මා/කොස්ගහහින්න වි., බඹරගස්වැව, ගලේවෙල | |
| | 5. මා/වල්ගම්වැව වි., | |
| | 6. මා/නාගලවැව වි., | |
| | 7. මා/පහල දිග්ගල වි. | |
| | 8. මා/මොරගොල්ල වි. ගලේවෙල | |
| | 9. මා/රත්මල්ගහඇල වි. | |
| | 10. මා/කිරලගොල්ල වි. | |
| | 11. මා/මොනරවිල වි. | |
| | 12. මා/පොල්වත්තාකන්ද වි. | |
| | 13. මා/පිටකන්ද වි. | |
| | 14. මා/මඩකුඹුර වි. | |
| | 15. මා/වෙලන්ගහවත්ත වි. | |
| | 16. මා/කවුඩාගම්මන වි. | |
| | 17. මා/නාරංගමුව වි., ලග්ගල, පල්ලේගම | |

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | පාසලේ නම | පාසල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගේ ලිපිනය |
|---|---|---|
| මාතලේ ... | 18. මා/ගල්ගෙදරවෙල වි., ගල්ගෙදරවෙල ... ... | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරි, අධ්‍යාපන කාර්යාලය, මාතලේ |
| | 19. මා/පූවක්පිටිය වි., ගහුල, පූවක්පිටිය | |
| | 20. මා/කරගහතැන්න වි., ගම්මඩුව | |
| | 21. මා/අකරහඩුව වි. | |
| | 22. මා/ඉමාඩුව වි. | |
| | 23. මා/ගුරුවෙල වි. | |
| | 24. මා/මඩුමාන වි. | |
| | 25. මා/මොරගොල්ල, වි., ඕපල්ගල | |
| | 26. මා/හඳුන්ගමුව වි. | |
| | 27. මා/ඇටන්වෙල වි. | |
| | 28. මා/කහගල වි. | |
| | 29. මා/කිවුලවාඩිය වි. | |
| | 30. මා/රඹුක්ඔලුව වි., | |
| | 31. මා/ලේල්ඔය වි. | |
| | 32. මා/මැදකන්ද වි. | |
| | 33. මා/හතමුනගාල වි. | |
| නුවරඑළිය ... | 1. නු/කන්දෙයාය වි., මඩුල්ල ... ... | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නුවරඑළිය |
| | 2. නු/සමගිපුර වි. | |
| | 3. නු/කුංහිටියාව වි. | |
| | 4. නු/අරුක්වත්ත වි. | |
| | 5. නු/මැදකඳුර වි. | |
| | 6. නු/සාගලපුර වි. | |
| | 7. නු/පණ්ඩිතයාකුඹුර වි. | |
| | 8. නු/නාවෙල වි. | |
| | 9. නු/සෙනරත්පුර වි. | |
| | 10. නු/කීනගොල්ල වි. | |
| | 11. නු/තැන්නෙබෝධිය වි. | |
| | 12. නු/දලිවල වි. | |
| | 13. නු/ගල්කඩවල වි. | |
| | 14. නු/හිඟුරේවෙල වි. | |
| | 15. නු/ඇල්ලලන්ද වි., අඹගහවත්ත | |
| | 16. නු/නාගිලිඇල්ල වි., වැලිමඩ | |
| | 17. නු/පත්වැව වි. | |
| | 18. නු/මහකුඹුර වි. | |
| | 19. නු/කිතුලේබැද්ද වි., මාස්වෙල | |
| | 20. නු/රම්බොඩගම වි. | |
| | 21. නු/දුනුකේදෙනිය වි. | |
| | 22. නු/මීනුවන්දෙනිය වි. | |
| බණ්ඩාරවෙල ... | 1. බ/වෙරගොඩ ක. වි., ලුනුගල ... ... | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, බණ්ඩාරවෙල |
| | 2. බ/පල්ලෙකීරුව ක. වි., ලුනුගල | |
| | 3. බ/උඩකීරුව ක. වි., ලුනුගල | |
| | 4. බ/පිස්සගම ක. වි. හොප්ටන්., | |
| | 5. බ/මඩුවත්ත ක. වි., හෝප්ටන් | |
| | 6. බ/කොහානාවල ක. වි., මඩොල්සිම | |
| | 7. බ/මඩුගස්තලාව ක. වි., මඩොල්සිම | |
| | 8. බ/ඉලිපතුතැන්න වි., කහටරුප්ප | |
| | 9. බ/ගල්වෙලගම වි., මඩොල්සිම | |
| | 10. බ/ගැරඩිඇල්ල වි., හොප්ටන් | |
| | 11. බ/බඳුලුදෙන ක. වි., හල්පේ, බලංගොඩ හරහා | |
| | 12. බ/වෙලන්විට ක. වි., නිකපොත | |
| | 13. බ/මාලදෙල ක. වි., හල්දුම්මුල්ල | |
| | 14. බ/මොරකැටිය ක. වි., නිකපොත | |
| | 15. බ/දෙඩන්ගොල්ල ක. වි., බල්ලකොටුව | |
| | 16. බ/පහලඇල්ල ක. වි., ඇල්ල | |
| | 17. බ/නවුඩන්තේවෙල ක. වි., දඹාන | |
| | 18. බ/හල්පෝරුයාය ක. වි., මහියංගනය | |
| | 19. බ/කුඩාලුනුක ක. වි., යල්වෙල, බිබිල | |
| | 20. බ/දික්යාය ක. වි., අරාව | |
| | 21. බ/බණ්ඩාරකැටිය ක. වි., බදුල්ල | |
| | 22. බ/අරාව ක. වි., මීගහකිවුල | |
| | 23. බ/බෝපිටිය ක. වි., හාලිඇල | |
| | 24. බ/බුදුගේකන්ද ක වි., තැන්නේපංගුව | |
| ... | 25. බ/නාගොල්ල ක. වි., මාලියද්ද, හාලිඇල | |
| | 26. බ/කීනකැලේවත්ත ක. වි., කන්දේගෙදර | |
| | 27. බ/ගත්තිලේගම ක. වි., තැන්නේපංගුව | |
| | 28. බ/මාලියද්ද ක. වි., මාලියද්ද, හාලිඇල | |
| | 29. බ/පොල්ගහඅරාව ක. වි., මීගහකිවුල | |
| | 30. බ/මුඩහමුව ක. වි., කන්දකැටිය | |
| | 31. බ/ඉටිතැන්පොල ක. වි., පිටමාරුව | |
| | 32. බ/සූරියගොල්ල ක. වි., පිටමාරුව | |
| | 33. බ/කලුගහකඳුර ක. වි., පිටමාරුව | |
| | 34. බ/මහගම ක. වි., කුරුවිතැන්න | |
| | 35. බ/මැදඔය ක. වි., මීගහකිවුල | |
| | 36. බ/ජේරගස්යාය ක. වි., මීගහකිවුල | |
| | 37. බ/වැවතැන්න ක. වි., කන්දකැටිය | |
| | 38. බ/කුඩාවිල ක. වි., පදියතලාව | |

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | පාසලේ නම | පාසල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගේ ලිපිනය |
|---|---|---|
| බණ්ඩාරවෙල ... | 39. බ/තිඹිරාන ක. වි., පදියතලාව ... ... | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, බණ්ඩාරවෙල |
| | 40. බ/කන්දෙගන්විල ක. වි., දඹාන | |
| | 41. බ/කන්දෙගම ක. වි., ඌරනිය | |
| | 42. බ/හෙඹරාව ක. වි., මහියංගනය | |
| | 43. බ/අලුකැටියාව ක. වි., අලුකැටියාව, බිබිල | |
| | 44. බ/සේරුපිටිය ක. වි., ඇකිරියන්කුඹුර | |
| | 45. බ/කුකුලාපොල ක. වි., වේවත්ත, බිබිල | |
| | 46. බ/වටවන ක. වි., මහියංගනය | |
| | 47. බ/කෙහෙල්පොත ක. වි., මහියංගනය | |
| | 48. බ/ගල්බොක්ක ක. වි., හෙවන්වත්ත, බිබිල | |
| | 49. බ/බෝගොඩතලාව ක. වි., ගලඋඩ | |
| | 50. බ/වත්තෙකැලේ ක. වි., එගොඩවෙල, බදුල්ල | |
| | 51. බ/කොස්ගොල්ල ක. වි., බදුල්ල | |
| | 52. බ/කුට්ටියගොල්ල ක. වි., කහටරුප්ප | |
| | 53. බ/හුඹහමඩ ක. වි., කැන්දගොල්ල | |
| | 54. බ/වෙහෙරගල ක. වි., කන්දකැටිය | |
| මොණරාගල ... | 1. මො/වෙහෙරබැදිතැන්න වි., හොප්ටන් ... ... | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරි, අධ්‍යාපන කාර්යාලය, මොණරාගල |
| | 2. මො/බෝගහපැලැස්ස වි., බඩල්කුඹුර | |
| | 3. මො/හම්බෙගමුව ජනපද වි., හම්බෙගමුව | |
| | 4. මො/අළුත්වැව වි., හම්බෙගමුව | |
| | 5. මො/හම්බෙගමුව ම. වි., හම්බෙගමුව | |
| | 6. මො/මාගම බහිරාව වි., ඇඹිලිපිටිය | |
| | 7. මො/හබරලුවැව වි., ඇඹිලිපිටිය | |
| | 8. මො/ලුනුගල වි., ඌව පැල්වත්ත | |
| | 9. මො/හෙලගල්බොක්ක වි., වැල්ලවාය | |
| | 10. මො/බලහරුව වි., තණමල්විල | |
| | 11. මො/විහාරගල වි., මොණරාගල | |
| | 12. මො/හොරොම්බුව වි., මොණරාගල | |
| | 13. මො/ඇත්පට්ටිය වි., බිබිලගම | |
| | 14. මො/කහම්බාන වි., මොණරාගල | |
| | 15. මො/සියඹලාගුනේ වි., වැල්ලවාය | |
| | 16. මො/නියදගල වි., සූරියආර, තණමල්විල | |
| | 17. මො/කොටියාගල වි., මොණරාගල | |
| | 18. මො/ඇතිමලේ පියවර 11 වි., මොණරාගල | |
| | 19. මො/උඩික්කැපූආර වි., දෙඹගහවෙල | |
| | 20. මො/කොටිගල්පොල වි., මොණරාගල | |
| | 21. මො/අළුගල්ගේ වි., සියඹලාණ්ඩුව | |
| | 22. මො/කෝන්ගහපිටිය වි., ඔක්කම්පිටිය | |
| | 23. මො/තඹාන වි., දඹගල්ල | |
| | 24. මො/දූලිව වි., දඹගල්ල | |
| | 25. මො/මීයාගල වි., දඹගල්ල | |
| | 26. මො/තම්පලාවෙල වි., දඹගල්ල | |
| | 27. මො/දනකිරිය වි., බුද්දම | |
| | 28. මො/බරවාය වි., සියඹලාණ්ඩුව | |
| | 29. මො/බදුලුවෙල වි., මොණරාගල | |
| | 30. මො/රිටිගහවත්ත වි., බුද්දම | |
| | 31. මො/නෙල්ලියද්ද වි., නාමල්ඔය, ඉගිනියාගල | |
| | 32. මො/රත්මල්ගහඇල්ල වි., නාමල්ඔය, ඉගිනියාගල | |
| | 33. මො/ගල්ගමුව වි., නාමල්ඔය, ඉගිනියාගල | |
| | 34. මො/කහටියන්වෙල වි., මැදගම | |
| | 35. මො/අලාන වි., මැදගම | |
| | 36. මො/සේරව වි., පිටකුඹුර | |
| | 37. මො/බුලුපිටිය වි., පිටකුඹුර | |
| | 38. මො/කොස්සල්පොල වි., දෙඹගහවෙල | |
| | 39. මො/කීනගොඩ වි., මැදගම | |
| | 40. මො/බලානේගම වි., සියඹලාණ්ඩුව | |
| | 41. මො/තලවබැද්ද ක. වි., දෙඹගහවෙල | |
| | 42. මො/ගලේඅරාව ක. වි., සියඹලාණ්ඩුව | |
| | 43. මො/බඹරගස්රොද ක. වි., බුද්දම | |
| | 44. මො/කණවේගල්ල ක. වි., ඇකිරියන්කුඹුර | |
| | 45. මො/බදුල්ල ගම්මන ක. වි., බිබිල | |
| | 46. මො/මොණරවාන ක. වි., මැදගම | |
| | 47. මො/රත්තනදෙනිය ක. වි., බකිණිගහවෙල | |
| | 48. මො/කැන්දවින්න ක. වි., මැදගම | |
| | 49. මො/තැරැල ක. වි., මොණරාගල | |
| හලාවත ... | 1. හලා/දිවුල්ලැපිටිය වි., මහගිරිල්ල ... | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, හලාවත |
| | 2. හලා/නිරාලියැද්ද වි., හීලෝගම | |
| | 3. හලා/පන්නව වි., කොබෙයිගනේ | |
| | 4. හලා/පුබ්බිලිය වි., කොබෙයිගනේ | |
| | 5. හලා/වඳුරුස්ස වි., අවුලේගම | |
| | 6. හලා/නවගත්තේගම වි., නවගත්තේගම | |
| | 7. හලා/සියඹලාගස්හේන වි., කොට්ටුකච්චිය | |
| | 8. හලා/ඉගිනිවිටිය වි., නවගත්තේගම | |
| | 9. හලා/ඉහලකොලඑලිය වි., පල්ලම | |

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | පාසලේ නම | පාසල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරීගේ ලිපිනය |
|---|---|---|
| හලාවත | 10. හලා/ඉහලකම්මන වි., පල්ලම | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, හලාවත |
| | 11. හලා/උඩුනෝව වි., මොන්නැකුලම | |
| | 12. හලා/ඔට්ටුකුලම වි., රතඹලාඔය | |
| | 13. හලා/කටුපොත වි., පල්ලම | |
| | 14. හලා/කෙය්යදලුව වි., පල්ලම | |
| | 15. හලා/දිවුල්වැව වි., ආනමඩුව | |
| | 16. හලා/පුනවිටිය වි., ආඩිගම | |
| | 17. හලා/වත්තේගෙදර වි., මහඋස්වැව | |
| | 18. හලා/සෙම්බුකුලිය වි., මහකුඹුක්කඩවල | |
| | 19. හලා/කෝන්කඩවල වි., නවගත්තේගම | |
| | 20. හලා/දංගහවැව ර. වි., නවගත්තේගම | |
| | 21. හලා/සියඹලාව ර. වි., තබ්බෝව | |
| | 22. හලා/ගල්කුලම ර. වි., නවගත්තේගම | |
| | 23. හලා/ඉහලකුරුකැටියාව ර. වි., නවගත්තේගම | |
| | 24. හලා/කේබනුරුව ර. වි., තබ්බෝව | |
| | 25. හලා/කුඹුක්වැව ර. වි., ඉහලපුලියන්කුලම | |
| | 26. හලා/රඹකනයාගම වි., නවගත්තේගම | |
| | 27. හලා/පහල පුලියන්කුලම ර. වි., ඉහල පුලියන්කුලම | |
| | 28. හලා/මුරුක්කුවටවන වි., තබ්බෝව | |
| | 29. හලා/පහරිය වි., ඉහල පුලියන්කුලම | |
| | 30. හලා/පහලකුරුකැටියාව වි., තබ්බෝව | |
| | 31. හලා/පුක්කුලම ර. වි., මරිච්චකට්ටි | |
| | 32. හලා/කරඩිපූවල් වි., කරඩිපූවල් | |
| | 33. හලා/කරතිව් වි., පොම්පරිප්පු | |
| | 34. හලා/වේලාසිය වි., මදුරන්කුලිය | |
| | 35. හලා/එලුවන්කුලම ර. වි., එලුවන්කුලම | |
| | 36. හලා/සිප්පිකලාන වි., බිංගිරිය | |
| | 37. හලා/තල්ගහපොත්ත වි., උඩුබද්දව | |
| | 38. හලා/ඉහලකීනියම වි., වීරපොකුන | |
| | 39. හලා/මොලඑලිය වි., තිසෝගම | |
| කුරුණෑගල | 1. කු/තැටිය වි., නිකදලුපොත | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කුරුණෑගල |
| | 2. කු/කිතුල්වැහැර වි., වාරියපොල | |
| | 3. කු/හංවැල්ල වි., බණ්ඩාරකොස්වත්ත | |
| | 4. කු/හිඳගහවැව වි., බණ්ඩාරකොස්වත්ත | |
| | 5. කු/මඩඉන වි., කුරටිහේන | |
| | 6. කු/කරඹේ වි., මහව | |
| | 7. කු/කඳුබඩගම වි., මහව | |
| | 8. කු/පලාපත්වල වි., අඹන්පොල | |
| | 9. කු/නෙලුම්පත්වැව වි., අඹන්පොල | |
| | 10. කු/බක්මීවැව වි., අඹන්පොල | |
| | 11. කු/බමුනුගම වි., නාගොල්ලාගම | |
| | 12. කු/බෙරුවැව වි., අඹන්පොල | |
| | 13. කු/වන්නි අමුනුකොලේ වි., මහනාන්නේරිය | |
| | 14. කු/තම්මැන්නාව වි., තඹුත්ත | |
| | 15. කු/මීගලෑව වි., මීගලෑව | |
| | 16. කු/මැදින්නෝරුව වි., මීගලෑව, නෑගම්පහ | |
| | 17. කු/ගල්පිටිය වි., ගිරාතලාන, නෑගම්පහ | |
| | 18. කු/එරියාව වි., ඇහැටුවැව | |
| | 19. කු/ගම්පොල වි., පහලගිරියාව | |
| | 20. කු/කටුපොතාන වි., තඹුත්ත | |
| | 21. කු/පොතානේගම වි., කුඩාකන්නෝරුව, නෑගම්පහ | |
| | 22. කු/ඉහල මරදන්කඩවල වි., පහලගිරිබාව | |
| | 23. කු/පාඩිපංචාව වි., ගල්ගමුව | |
| | 24. කු/ඉහලකෝන්වැව වි., ගල්ගමුව | |
| | 25. කු/සෝලේ වි., වරාවැව | |
| | 26. කු/විතාදෙනිගම වි., ඇහැටුවැව | |
| | 27. කු/අංගමුගම වි., කෝන්වැව | |
| | 28. කු/ගල්කැටියාගම වි., පොල්පිතිගම | |
| | 29. කු/දගම වි., මාඑලිය | |
| | 30. කු/මඩහපොලකන්ද වි., මඩහපොල | |
| | 31. කු/ඉම්හාමිනේගම ක. වි., මඩහපොල | |
| | 32. කු/පහලහම වි., මකුල්පොත | |
| | 33. කු/නියදවනේ වි., පොල්පිතිගම | |
| | 34. කු/දිගන්කෝන්වැව වි., නාගොල්ලාගම | |
| | 35. කු/හඳපන්දූනුගම වි., නාගොල්ලාගම | |
| | 36. කු/උයන්ගල්ල වි., නිකදලුපොත | |
| | 37. කු/දීගම වි., කුඹුක්ගැටේ | |
| | 38. කු/තෙන්නකෝන්ගම වි., මෙරෙගොල්ලාගම | |
| | 39. කු/වම්බටුවැව වි., මොරගොල්ලාගම | |
| | 40. කු/පලුගහතැන්න වි., දෙල්විට | |
| | 41. කු/ඇරපොලකන්ද වි., අංහන්දිය | |
| | 42. කු/බුලුවලකන්ද වි., අඹකොටේ | |
| | 43. කු/කිරිවත්ගල්ල වි., දෙල්විට | |

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | පාසලේ නම | පාසල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගේ කාර්යාලය |
|---|---|---|
| අනුරාධපුර ... | 1. අ/පරනහල්මිල්ලෑව වි., ඇටවීරගොල්ලෑව | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අනුරාධපුර |
| | 2. අ/ගල්පොත්තේගම වි., අනුරාධපුර | |
| | 3. අ/මානින්ගමුව වි., ඇලයාපත්තුව | |
| | 4. අ/කරම්බන්කුලම වි., කිරිගල්වැව | |
| | 5. අ/වලහහැංගුන වැව වි., රඹෑව | |
| | 6. අ/වන්නිපලුගොල්ලෑව වි., ගම්බිරිගස්වැව | |
| | 7. අ/මහකුඹුක්ගොල්ලෑව වි., පූනෑව | |
| | 8. අ/හැලඹගස්වැව වි., ගම්බිරිගස්වැව | |
| | 9. අ/ගෝනපැටියාව වි., සීප්පුකුලම | |
| | 10. අ/මින්හෙට්ටිගම වි., ඇටවීරගොල්ලෑව | |
| | 11. අ/තම්මැන්නාකුලම වි., පෙරියකුලම | |
| | 12. අ/ඉදිගොල්ලාව යකාවැව වි., | |
| | 13. අ/නබඩවැව කාමරවැව වි. | |
| | 14. අ/කෝන්ගොල්ලාව වි. | |
| | 15. අ/පදවිය යාය 2 වි. | |
| | 16. අ/පදවිය බාලයාවැව වි. | |
| | 17. අ/කරනගොල්ලෑව වි. | |
| | 18. අ/ඇලපත්තුව වි. | |
| | 19. අ/පුස්දිවුල්වැව වි., පලුගස්වැව | |
| | 20. අ/වායාඋල්පත වි., පලුගස්වැව | |
| | 21. අ/කැලෑව සුමන වි. | |
| | 22. අ/වෙම්බුවැව වි., සිවලාකුලම | |
| | 23. අ/උඩිස්සන්කුලම වි., මෙගොඩවැව | |
| | 24. අ/පැතිස් රඹෑව වි., මරදන්කඩවල | |
| | 25. අ/මීවැල්ලාව වි., මරදන්කඩවල | |
| | 26. අ/බංඩාරඋල්පත වි., කැබිතිගොල්ලෑව | |
| | 27. අ/පදවි පියවර 75 වි., පදවි ශ්‍රීපුර | |
| | 28. අ/පදවි ජයන්ති වි., පදවි ශ්‍රී පුර | |
| | 29. අ/ගල්ලැල්ලේගම වි., කිරිගල්වැව | |
| | 30. අ/කුඩාකුඹුක්වැව වි., කඹුත්තේගම | |
| | 31. අ/දෙල්නේගම වි., තලාව | |
| | 32. අ/කත්තරගම වි., නෑගම්පහ | |
| | 33. අ/මකුලෑව වි., කටියාව | |
| | 34. අ/හුරිගස්වැව වි., කටියාව | |
| | 35. අ/අඹගස්වැව අශෝක ජයන්ති වි., හොරොව්පතාන | |
| | 36. අ/උඩිස්සන්කුලම නිකවැව වි., ගලෙන්බිඳුනුවැව | |
| පොළොන්නරුව ... | 1. පො/දිඹුලාගල කාශ්‍යප වි., මනම්පිටිය ... ... ... | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, පොළොන්නරුව |
| | 2. පො/දලුනාග ක. වි., මනම්පිටිය | |
| | 3. පො/කිරිවැට්දමන ක. වි., පුලස්තිගම | |
| | 4. පො/සෝමාවතී ක. වි., පුලස්තිගම | |
| | 5. පො/සොරිවිල රෝහන ක. වි., මනම්පිටිය | |
| | 6. පො/කලුකැලෑව ක. වි. | |
| | 7. පො/යක්කුරේ ක. වි. | |
| | 8. පො/කුමාරඇල්ල ක. වි. | |
| | 9. පො/වඩිගවැව ක. වි. | |
| | 10. පො/මීගස්වැව ක. වි. | |
| | 11. පො/කහඹිලියාව ක. වි. | |
| වවුනියාව ... | 1. ව/පිරප්පන්මඩුව සිංහල ක. වි., පිරප්පන්මඩුව, මාමඩුව, වවුනියාව ... | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, වවුනියාව |
| | 2. ව/කුකුලාව සිං. ක. වි., මුලතිව් | |
| | 3. ව/විලයඌරුව සිං. ක. වි., පාවන්කුලම | |
| | 4. ව/මහකච්චකොඩිය සිං. ක. වි., මාමඩුව | |
| | 5. ව/වාරිකුට්ටුඌරුව සිං. ක. වි., ඔමන්තේ | |
| අම්පාර ... | 1. අම්/බණ්ඩාරදූව වි., කොහොඹාන ... ... ... | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, අම්පාර |
| | 2. අම්/මොරගහපල්ලම වි., ඉඟිනියාගල | |
| | 3. අම්/කිවුලේගම වි., ඉඟිනියාගල | |
| | 4. අම්/දේවාලහිඳ වි., ඉඟිනියාගල | |
| | 5. අම්/පොල්ලෙබැද්ද වි., මහඔය | |
| | 6. අම්/දමනේවෙල වි., අරගන්විල | |
| | 7. අම්/කුරුඳුවින්න වි., මහඔය | |
| | 8. අම්/කෝමාන වි., දෙරකුඹුර, පදියතලාව | |
| | 9. අම්/දෙමෝදර වි., පදියතලාව | |
| | 10. අම්/මරංගල වි., පදියතලාව | |
| | 11. අම්/බරාපිටිය වි., සේරන්කඩ | |
| | 12. අම්/ඇල්ලෙගොඩ වි., මහඔය | |
| | 13. අම්/මිරිස්වත්ත වි., පදියතලාව | |
| | 14. අම්/වේලුසුමන වි., පරගහකැලේ | |
| | 15. අම්/හිමිදුරාව වි., උහන | |
| | 16. අම්/කොටිකේවල වි., සේරන්කඩ | |
| | 17. අම්/කෝලිකේ වි., පදියතලාව | |
| | 18. අම්/ඉද්දපොල වි., මහඔය | |
| | 19. අම්/මිරිස්වත්ත වි., පදියතලාව | |
| | 20. අම්/කුඩාහරස්ගල වි., මහඔය | |
| කල්මුනේ ... | 1. කමු/බත්මිටියාව සිං. වි., මොණරාගල ... ... ... | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, කල්මුනේ |
| | 2. කමු/කුමන වි. | |

2. **සේවයේ යෙදීමේ නියමයන් හා සේවා කොන්දේසි :—**

(අ) (I) මෙම තනතුරු ස්ථිරය. අර්ථසාධක අරමුදල් පදනමක් මත වනු ඇත. පත්කරනු ලබන අපේක්ෂකයින් ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට යැවිය යුතු අතර, ඒ සඳහා රජයේ දායක මුදල ඒකාබද්ධ වැටුපෙන් 9%ක් වනු ඇත.

(II) සියලුම පත්කිරීම් අවුරුදු 3ක පරිවාස කාලයකට යටත් වේ.

(III) පත්වීමක් ලබන්නා ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ 10 : 6 සිට 10 : 14 දක්වා සහ 10 : 16 උප වගන්තිවල සඳහන් කොන්දේසි වලට යටත් විය යුතුය.

(IV) තෝරාගනු ලැබූ අයදුම්කරුවකු ඔහු/ඇය පත්කරනු ලබන පාසලේ සේවය කරන බවටත්, කවර හෝ හේතුවක් නිසා එම පාසලෙන් පිටතට ස්ථාන මාරුවක් ඉල්ලුම් නොකරන බවටත් ගිවිසුමකට අත්සන් කළ යුතු වේ. එහෙත් සේවයේ අවශ්‍යතාවයන් මත හෝ පරිපාලනමය වූ හේතූන් මත ඔහු/ඇය වෙනත් දිස්ත්‍රික්කයකට/පාසලකට මාරු කර යැවීමේ බලය දෙපාර්තමේන්තුව සතුව පවතිනු ඇත.

3. **මෙම තනතුරු සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේය :—**

(I) ඒකාබද්ධ වැටුප—වර්ෂයකට රු. 2,700 — 21 × 60 — රු. 3,960 (රු. 2,880 ට හා රු. 3,360 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්).

(II) කල්පිත වැටුප—වර්ෂයකට රු. 792—21 × 42—රු. 1,674 (රු. 918 ට හා රු. 1,254 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්).

4. **අවශ්‍ය සුදුසුකම් :—**

සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇ පහත සඳහන් කරුණු වලින් යුක්ත වන බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කර සිටිය යුතුය:—

(අ) විශිෂ්ට චරිතයකින් හා යහපත් ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් ද යුක්තව සිටින බව,

(ආ) 1973 ඔක්තෝබර් 31 දිනට වයස අවුරුදු 18 ට අඩු හෝ අවුරුදු 35 ට වැඩි හෝ නොවන බව,

(ඇ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය:—

(1) සිංහල භාෂාව සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතයට සාමාර්ථය ඇතිව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රය ලබා තිබීම. (යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථය ලබා තිබිය යුතුය).

**හෝ**

(II) සිංහල භාෂාව සහ අංකගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතයට සාමාර්ථය ඇතිව, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට වැඩි නොවන වාර ගණනක දී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. (යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය).

**සටහන.**—සිංහල භාෂාව සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතයට සාමාර්ථය ඇතිව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රයෙහි හෝ සිංහල භාෂාව සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය සාමාර්ථය ඇතිව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට වැඩි නොවන වාර ගණනක දී හෝ සමත් වී ඇති විෂයයන්ගෙන්, විෂයයන් හතරක් හෝ ඊට වැඩි ගණනකට සම්මාන ලබා ඇති අය පුරප්පාඩු පවත්නා පාසලකට ඉල්ලුම් කරනු ලබන අය අතර සිටිත් නම්, ඔවුන් කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ. මෙම ප්‍රමුඛතාවය දක්වනු ලබන්නේ මෙම ඡෙදයේ (ඈ) උප ඡෙදයේ සටහනෙහි සඳහන් ප්‍රමුඛ පිළිවෙලට යටත්වය.

(ඈ) තමන් පදිංචිය දක්වා ඇති ගමේ/ආසන්න ගමේ ස්ථිර පදිංචිකරුවෙකු බව පහත සඳහන් කුමන හෝ එක් ලියකියවිල්ලක් මගින් ඔප්පු කිරීමට අයදුම්කරු සමත් විය යුතුය :—

(I) ගමේ/ආසන්න ගමේ උපන් බව (උප්පැන්න සහතිකය මගින්)

(II) ගමේ/ආසන්න ගමේ ලියාපදිංචි ඡන්ද දායකයෙකු බව. (ඡන්දදායක ලේඛනයක සහතික කළ උධෘතයක් මගින්).

(III) අයදුම්කරුගේ දෙමාපියන් ස්ථිර පදිංචිකරුවන් වීමත් සමග පසුගිය අවුරුදු 3 ඇතුලත ස්ථිර පදිංචිකරුවෙකු බව. (ගෘහමූලික ලැයිස්තුව මගින්).

(IV) ගමේ/ආසන්න ගමේ පිහිටි පාසලකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙ.) විභාගය හෝ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය සමත් වූ බව. (අදාල සහතිකයක් මගින්).

**සටහන.**—පාසල්වල පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ දී ප්‍රමුඛත්වය දෙනු ලබන්නේ පහත සඳහන් අයුරිනි :—

(I) පාසල පිහිටි ගමේ ස්ථිර පදිංචිකරුවන්.

(II) පාසල පිහිටි ගමට ආසන්න ගමේ පදිංචිකරුවන්.

(III) පාසල පිහිටි ඡන්ද කොට්ඨාශයේ පදිංචිකරුවන්.

(IV) පාසල පිහිටි දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්.

(ඉ) අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඔවුන්ගේ ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය :—

(I) උප්පැන්න සහතිකය.

(II) අධ්‍යාපන සහතික

(III) මෑත දී ලබාගත් චරිත සහතික දෙකක්.

**සටහන.**—ඉහත සඳහන් ලියවිලිවල පිටපත් අමුණා එවීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

5. ඉල්ලුම් පත්‍ර සහ අනිකුත් අදළ ලියකියවිලි මෙම නිවේදනයේ I වැනි ඡෙදයේ පරිදි එවිය යුතු අතර, අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවල කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතුය.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡෙදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම සම්බන්ධයෙන් පොදු කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත් භාරගනු නො ලැබේ.

8. තැපැලේ දී සිදුවිය හැකි කවර ප්‍රමාදයක් හෝ මග හැරවීම සඳහා සිය ඉල්ලුම්පත් කල් වේලා ඇතිව ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලෙස ඉල්ලුම්කරුවන් වෙත මෙයින් දනුම් දෙනු ලැබේ.

ප්‍රේමදස උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 සැප්තැම්බර් මස 3 වැනි දින,
කොළඹ 2, අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පරිපාලන ශාඛාවේ දීය.
පා. ප. 12/615

දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ රජයේ සිංහල මාධ්‍ය දුෂ්කර පාසල්වල

සහතික පත්‍ර නොලත් සිංහල උපගුරු තනතුරු

ඉල්ලුම් කරන දුෂ්කර පාසල :————

1. මුලට පෙලපත් නාමය සහිත සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————
2. (I) ස්ථිර ලිපිනය :————
 (II) ඡන්ද කොට්ඨාශය :————
3. (I) ස්ථිර වශයෙන්ම පදිංචි ස්ථානය (ගම සඳහන් කරන්න) :————
 (ගැසට් නිවේදනයේ 4 (ඈ) ඡේදය අනුව)
 (II) එය අයත් ඡන්ද කොට්ඨාශය :————
4. ස්ත්‍රී/පුරුෂ භාවය :————
5. ඉල්ලුම්කරු අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට ඉදිරිපත් වූ පාසල :————
6. විවාහක ද අවිවාහක ද යන බව :————
7. උපන් දිනය හා ස්ථානය :————
8. 1973.10.31 දිනට වයස :————
9. (I) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————
 (II) අයදුම්කරුගේ මව උපන් ස්ථානය :————
10. ජාතිය :————
11. ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන්ද/ලියාපදිංචි වීමෙන් ද යන බව :————
12. සුදුසුකම් :————
 (1) ජ්‍යෙ.පා.ස./අ.පො.ස. (සාමාන්‍ය පෙළ) :————

| | වර්ෂය හා මාසය | විභාග අංකය | විෂයයන් | ලබා ඇති සාමාර්ථය (අදල කොටුවේ '√' සලකුණ යොදන්න) | | | කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|---|
| | | | | විශිෂ්ට | සම්මාන | සාමාන්‍ය | |
| පළමුවර | | | 1. | | | | |
| | | | 2. | | | | |
| | | | 3. | | | | |
| | | | 4. | | | | |
| | | | 5. | | | | |
| | | | 6. | | | | |
| | | | 7. | | | | |
| | | | 8. | | | | |
| දෙවනවර | | | 1. | | | | |
| | | | 2. | | | | |
| | | | 3. | | | | |
| | | | 4. | | | | |
| | | | 5. | | | | |
| | | | 6. | | | | |
| | | | 7. | | | | |
| | | | 8. | | | | |

 (2) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————

13. අයදුම්කරු රජයේ සේවයේ නියුක්තව සිටියේ නම් ඒ සම්බන්ධ විස්තර පහත සපයන්න :—
 (1) දෙපාර්තමේන්තුවේ නම :————
 (2) දරණ ලද තනතුර සහ එම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත ද යන බව :————
 (3) පත් වූ දිනය :————
 (4) අස් වූ දිනය සහ අස්වීමට හේතු :————
 (5) ගුරුවරයෙක් නම්, ලියාපදිංචි කිරීමේ අංකය සහ අන්තිමට සේවය කළ පාසල :————
14. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම් හෝ පළපුරුද්ද පිළිබඳ විස්තර :————

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පික විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය උඩ සේවයෙන් විශ්‍රාම ගන්වා නොමැති බවත්, තනතුර අත්හැර ගිය අයෙකු සේ සළකා නැති බවත්, මා පරම්පරාවෙන්/ලියාපදිංචි කිරීමෙන් ලාංකිකයෙකු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙලිවුවහොත් මා නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, පත්කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

දිනය :————

————,

අයදුම්කරු ගේ අත්සන.

(අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සේවය කරන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ සංස්ථාවේ ප්‍රධානියා මගින් ඉල්ලුම් පත්‍ර එවිය යුතුයි).

————ගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය.

————,

දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා හෝ ඒ වෙනුවට බලය ලත් නිලධාරියාගේ අත්සන.

තනතුර :————

ලිපිනය :————

දිනය :————.

9–286—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ධීවර දෙපාර්තමේන්තුව

**මීගමුව, තංගල්ල සහ යාපනය ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන ධීවර අභ්‍යාස පාඨමාලාව—සිංහල /දෙමළ මාධ්‍යය (1974 ජනවාරි)**

ඉහත සඳහන් ධීවර අභ්‍යාස මධ්‍යස්ථාන වලදී 1974 ජනවාරි මාසයේ දී ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ධීවර අභ්‍යාස පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මීගමුව හා තංගල්ල ධීවර අභ්‍යාස මධ්‍යස්ථාන දෙකෙහි ඉගැන්වීමේ භාෂා මාධ්‍යය සිංහල භාෂාව වන අතර, යාපනය ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ ඉගැන්වීමේ භාෂා මාධ්‍යය දෙමළ භාෂාව වේ.

2. අයදුම්කරුවන් විසින් අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව, පිළියෙල කොට තමන් තෝරා ගන්නා ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විදුහල්පති වෙත 1973 නොවැම්බර් මස 10 වෙනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව අයදුම් කරුවන්ට දන්වනු ලබන අතර, තැපෑලේදී හෝ වෙනයම් මොනම ක්‍රමයකින් හෝ නැති වන ඉල්ලුම් පත්‍ර ගැන වගකියනු නොලැබේ. ඒ ඒ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විදුහල්පතිගේ ලිපිනය පහත සඳහන් වේ :—

(අ) විදුහල්පති, ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, මීගමුව.

(ආ) විදුහල්පති, ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, තංගල්ල.

(ඇ) විදුහල්පති, ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, යාපනය.

3. **විෂය ප්‍රමාණය හා පුහුණුවීමේ කාලය.**—ධීවර ආම්පන්න, මසුන් මැරීමේ ක්‍රම, ඇන්ජින් ක්‍රියා කරවීම හා නඩත්තු කිරීම යන මේවා පුහුණුකරවීම මෙම පාඨමාලාවට ඇතුළත් වේ. මෙම පාඨමාලාව සඳහා ගතවන කාලය දළ වශයෙන් සමසකි. එක් පාඨමාලාවක් සඳහා අභ්‍යාසලාභීන් 15 දෙනෙකුට ඉඩකඩ සැලසේ.

4. **පුහුණු කිරීමේ කොන්දේසි.**—(i) පුහුණුවීමේ කාලසීමාව තුළදී මීගමුව ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ අභ්‍යාසලාභීනට අභ්‍යාස මධ්‍යස්ථානයේම නතරවීමේ පහසුකම් සලසනු ලබන අතර, තංගල්ල හා යාපනය ධීවර අභ්‍යාස මධ්‍යස්ථාන දෙකේ අභ්‍යාසලාභීන්හට නතරවීමේ පහසුකම් සලසනු නොලැබේ.

(ii) පුහුණුවීම අවසන් කිරීමෙන් පසු රජය යටතේ රැකියාවක් ලබා ගැනීමේ කිසිම අයිතිවාසිකමක් පුහුණුවන්නන් හට නොමැත.

(iii) පුහුණුවීමේ කාල සීමාව තුළදී පුහුණුවන්නන් විසින් අභ්‍යාස මධ්‍යස්ථානයේ නීතිරීති පිළිපැදිය යුතුය.

(iv) පුහුණුවන්නන්ගෙන් ගාස්තු අය කිරීමක් නැත.

(v) මධ්‍යස්ථානයට අයත් අභ්‍යාස බෝට්ටු තුළ මුහුදේදී පරීක්ෂණ පවත්වා පෙන්වීම අභ්‍යාසයට ඇතුළත් වේ.

(vi) දිනකට රු. 2 ක යැපීම් දීමනාවක් අභ්‍යාසලාභීන් හට ගෙවනු ලැබේ.

(vii) තෝරාගත් අයදුම් කරුවන් රු. 50 ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය. පාඨමාලාව අවසානයේ එම මුදල ආපසු දෙනු ලැබේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(1) මෙම අභ්‍යාස පාඨමාලාව සඳහා ඉදිරිපත් වන සෑම අයදුම් කරුවෙකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1973.11.10 වෙනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු බවට,

(ආ) විශිෂ්ඨ චරිතයකින් සහ හොඳ ශරීර සනීපයකින් යුතු බවට,

(ඇ) සිංහල/දෙමළ කණිෂ්ඨය දක්වා ඉගෙනීම කර ඇති බවට,

**සටහන.**—උද්‍යෝගිමත් ධීවර කාර්මිකයින් වන්නාවූද, එවැන්නන්ගේ දරුවන් වන්නාවූද අයදුම් කරුවන් හට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(2) අයදුම් කරුවන් විසින් පහත සඳහන් සහතික වල පිටපත් (මුල් පිටපත් නොවේ) තම අයදුම් පත් සමග ඉදිරිපත් කළ යුතුයි :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) අයදුම් කරුගේ සහ ඔහුගේ පියාගේ රැකියාවන් සඳහන් කරන ග්‍රාමසේවකගෙන් ලබාගත් සහතිකයක්.

6. නියමිත ස්ථානයකදී නියමිත වේලාවක සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට අයදුම්කරුවන් සූදානමින් සිටිය යුතුය. මෙයට අදාළ ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

7. අභ්‍යාස පාඨමාලාව ආරම්භ කෙරෙන දිනය ඒ සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් හට දැනුම් දෙනු ලැබේ.

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

1973 සැප්තැම්බර් මස 03 වැනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේදීය.

### අයදුම් පත්‍ර ආකෘතිය

......ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයෙහි ධීවර අභ්‍යාස පාඨමාලාව—සිංහල දෙමළ මාධ්‍යය—1974 ජනවාරි

1. සම්පූර්ණ නම :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.
2. ස්ථිර ලිපිනය :————.
3. (අ) උපන් දිනය :————.
   (ආ) 1973.11.10 දිනට වයස :—
   අවුරුදු :———, මාස :———, දින :———.
4. ජාතිය :————.
5. අයදුම්කරුගේ දැන් රක්ෂාව :————.
6. අයදුම්කරු රක්ෂාවෙහි නියුක්ත ස්ථානය :————.
7. අයදුම්කරු ධීවරයෙකු නම් :————.
   (අ) මසුන් මැරීමේ ආකාරය :————.
   (ආ) බෝට්ටුවක් සහ/හෝ ආම්පන්න හිමියකුද යන වග : ————.
8. අයදුම්කරුගේ පියාගේ දැන් රක්ෂාව :————.
9. අයදුම්කරුගේ පියා රක්ෂාව කරන ස්ථානය :————.
10. අයදුම්කරු විවාහකද, අවිවාහකද, වැන්දඹු පුරුෂයෙක්ද යන වග :————.
    (විවාහක නම් දරුවන් ගණන සඳහන් කරන්න)
11. අධ්‍යාපනික සුදුසුකම් :————.
12. දැනට ලබා ඇති අභ්‍යාසයන් පිළිබඳ විස්තර :————.
13. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම පිණිස යම් විශේෂ හිමිකමක් තිබේනම් ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9-287—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

**මීගමුව, තංගල්ල සහ යාපනය ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයන් පුහුණු කිරීමේ පාඨමාලව—සිංහල/දෙමළ මාධ්‍යය (1974 ජනවාරි)**

ඉහත සඳහන් ධීවර අභ්‍යාස මධ්‍යස්ථාන යන්හිදී 1974 ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයන් පුහුණු කිරීමේ පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ලන අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මීගමුව හා තංගල්ල ධීවර අභ්‍යාස මධ්‍යස්ථාන දෙකෙහි ඉගැන්වීමේ භාෂා මාධ්‍යය සිංහල භාෂාව වන අතර, යාපනය ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ ඉගැන්වීමේ භාෂා මාධ්‍යය දෙමළ භාෂාව වේ.

2. අයදුම්කරුවන් විසින් අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව, පිළියෙල කොට තමන් තෝරා ගත් අභ්‍යාස මධ්‍යස්ථානයේ විදුහල්පති වෙත 1973 නොවැම්බර් මස 10 වෙනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව අයදුම් කරුවන්ට දන්වනු ලබන අතර, තැපෑලේදී හෝ වෙනයම් මොනම ක්‍රමයකින් හෝ නැති වන ඉල්ලුම් පත්‍ර ගැන වගකියනු නොලැබේ. ඒ ඒ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයන්හි විදුහල්පතිගේ ලිපිනය පහත සඳහන් වේ :—

(අ) විදුහල්පති, ධීවර අභ්‍යාස විද්‍යාලය, මීගමුව.

(ආ) විදුහල්පති, ධීවර අභ්‍යාස විද්‍යාලය, තංගල්ල.

(ඇ) විදුහල්පති, ධීවර අභ්‍යාස විද්‍යාලය, යාපනය.

3. පුහුණුවීමේ පාඨමාලාවට බෝට්ටු තැනීම, සමුද්‍ර ඇන්ජින් සර්විස් කිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, ක්‍රියා කරවීම, සිද්ධාන්ත සහ මූල ධර්ම පිළිබඳ පුහුණුවක් ලබාදීම ඇතුළත් වේ. මෙම පුහුණු කිරීමේ කාල පරිච්ඡේදය දළ වශයෙන් දොළොස් මසකි. එකවරකට එක් පාඨමාලාවක් සඳහා පුහුණු වන්නන් දස දෙනෙකුට ඉඩකඩ සැලසේ.

4. **පුහුණු කිරීමේ කොන්දේසි.**—(i) පුහුණුවීමේ කාලසීමාව තුළදී මීගමුව ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ පුහුණුවන්නන් හට අභ්‍යාස මධ්‍යස්ථානයේම නතරවීමේ පහසුකම් සලසනු ලබන අතර, තංගල්ල හා යාපනය අභ්‍යාස මධ්‍යස්ථාන දෙකේ අභ්‍යාසලාභීන්ට නතරවීමේ පහසුකම් සලසනු නොලැබේ.

(ii) පුහුණුවීම අවසාන කිරීමෙන් පසු රජය යටතේ රැකියාවක් ලබා ගැනීමේ කිසිම අයිතිවාසිකමක් පුහුණුවන්නන් හට නොමැත.

(iii) පුහුණුවීමේ කාල සීමාව තුළදී පුහුණුවන්නන් විසින් අභ්‍යාස මධ්‍යස්ථානයේ නීතිරීති පිළිපැදිය යුතුය.

(iv) පුහුණුවන්නන්ගෙන් ගාස්තු අය කිරීමක් නොමැත.

(v) මධ්‍යස්ථානයට අයත් පුහුණු කිරීමේ යාත්‍රාවල මුහුදේදී පරීක්ෂණ පවත්වා පෙන්වීම අභ්‍යාසයට ඇතුළත් වේ.

(vi) දිනකට රු. 2 ක යැපීම් දීමනාවක් අභ්‍යාසලාභීන්ට ගෙවනු ලැබේ.

(vii) තෝරාගත් අයදුම් කරුවන් විසින් රු. 50 ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය. පාඨමාලාව අවසානයේ එම මුදල ආපසු දෙනු ලැබේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—මෙම පුහුණුවීමේ පාඨමාලාව සඳහා අයදුම්පත් එවනු ලබන සෑම අයදුම් කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1973.11.10 වෙනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි බවට.

(ආ) විශිෂ්ඨ චරිත ශුද්ධියකින් සහ හොඳ ශරීර සනීපයකින් යුත් බවට.

(ඇ) ගරාජයකදී, වැඩ පළකදී ලබාගත් අවුරුදු 3 ක ප්‍රායෝගික යාන්ත්‍රික පළපුරුද්ද.

(ඈ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අංක ගණිතය/ගණිතය ද ඇතුළුව විෂයයන් 4 කින් ලත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය.

6. අයදුම්පත් එවන්නන් විසින් පහත සඳහන් සහතික වල පිටපත් (මුල් පිටපත් නොවේ) තම අයදුම් පත් සමග ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ආ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) අයදුම්කරුගේ සහ ඔහුගේ පියාගේ රැකියාවන් සඳහන් කරන ග්‍රාමසේවකගෙන් ලබාගත් සහතිකයක්.

(ඉ) තමන් විසින් ලබා ඇති යාන්ත්‍රික පුහුණුව පිළිබඳ සහතිකය.

7. නියමිත ස්ථානයකදී නියමිත වේලාවක සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට අයදුම්කරුවන් සූදානමින් සිටිය යුතුය. මෙයට අදාළ ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

8. අභ්‍යාස පාඨමාලාව ආරම්භ කෙරෙන දිනය ඒ සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් හට දැනුම් දෙනු ලැබේ.

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

1973 සැප්තැම්බර් මස 03 වැනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේදීය.

**ආදර්ශ ආකෘති පත්‍රය**

..................................................................................................

ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයින් පුහුණු කිරීමේ අභ්‍යාස පාඨමාලාව—සිංහල/දෙමළ මාධ්‍යය, 1974—ජනවාරි

1. සම්පූර්ණ නම :————.

(අ) පෙළපත් නාමය :————.
(ආ) වෙනත් නම් :————.

2. ස්ථිර ලිපිනය :————.

3. (අ) උපන් දිනය :————.
(ආ) 1973.11.10 දිනට වයස :—
අවුරුදු :———, මාස :———, දින :———.

4. ජාතිය :————.

5. අයදුම්කරුගේ දැන් රැකියාව :————.

6. අයදුම්කරු රැකියාවෙහි නියුක්ත ස්ථානය :————.

7. අයදුම්කරු විවාහකද, අවිවාහකද, වැන්දඹු පුරුෂයෙක්ද යන වග :————. (විවාහක නම් දරුවන් ගණන සඳහන් කරන්න)

8. අධ්‍යාපනික සුදුසුකම් :————.

9 අයදුම්කරු විසින් ලබා ඇති යාන්ත්‍රික පුහුණු පිළිබඳ තොරතුරු :————.

10. මෙම අභ්‍යාස පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීමට යම් විශේෂ හිමිකමක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–287/2—73.09.14 දින අංක 77 දරන ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය—කෘෂිකර්මය පිළිබඳව ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාව

ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳව දෑ අවුරුදු ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාවට ඇතුළත් කරගැනීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන්නන් මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 1973 ඔක්තෝබර් මස 13 වන දිනට හෝ ඊට පෙර, කුණ්ඩසාලේ, ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයේ විදුහල්පතිට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

1. කෘෂිකර්ම පිළිබඳව මෙම දෑවුරුදු ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාව කොටස් දෙකකින් සමන්විතය.

පළමු කොටස (මුල් අවුරුද්දට)—කෘෂි රසායන විද්‍යාව, කෘෂි උද්භිද විද්‍යාව, කෘෂි ආර්ථික විද්‍යාව, හා ක්ෂෙත්‍ර අත්හද බැලීම, කෘෂි ඉංජිනේරු විද්‍යාව, i බෝග වගාව, i සත්ව පාලනය, i උද්‍යාන විද්‍යාව, i ගොවිපල් කාර්මික වැඩ, i (ශිෂ්‍යයින් සඳහා) සහ ගෘහ පාලන විද්‍යාව i (ශිෂ්‍යාවන් සඳහා) යන විෂයයන්ද,

දෙවන කොටස (අවසාන අවුරුද්දට)—පැළෑටි සංරක්ෂණය, ගොවිපල් පාලනය, ව්‍යාප්ති අධ්‍යාපනය, කෘෂි ඉංජිනේරු විද්‍යාව, ii බෝග වගාව, ii සත්ව පාලනය, ii උද්‍යාන විද්‍යාව, ii ගොවිපල් කාර්මික වැඩ, ii (ශිෂ්‍යයින් සඳහා) සහ ගෘහ පාලන විද්‍යාව, ii (ශිෂ්‍යාවන් සඳහා) යන විෂයයන්ද ඇතුළත්ය.

2. මෙම පාඨමාලාව ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයටම විවෘතය.

අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය:—

වයස.—1974 ජනවාරි මස 1 වන දිනට වයස අවුරුදු 17 ට නොඅඩු හා අවුරුදු 25 ට නොවැඩි විය යුතුයි.

**අධ්‍යාපනික සුදුසුකම්.**—ප්‍රායෝගික කෘෂිකර්ම පාඨශාලාවන්හි පාඨමාලා හැදෑරුවන්ද ඇතුළුව අයදුම්කරුවන්ට පහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් තිබිය යුතුය :—

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී—

(i) සිංහල/දෙමළ භාෂාව (‘‘අ’’ හෝ ‘‘ආ’’ නිර්දේශය),

(ii) අංක ගණිතය හෝ ගණිතය,

(iii) රසායන විද්‍යාව,

(iv) ජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ සත්ව විද්‍යාව යන විෂයයන් ඇතුලුව, යටත්පිරිසෙයින් විෂයයන් හයකින් වත් සමත්වී සිටීම.

(ආ) මෙම විෂයයන්ගෙන් අඩුම වශයෙන් විෂයයන් පහකින්වත් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයකදී එක්වරම සමත් වී තිබීම සහ එම විෂයයන් පහට භාෂාව විෂයය හෝ අංක ගණිතය/ගණිතය (ඉහත ‘‘අ’’ බලන්න) විෂයය හෝ ඇතුළත්ව තිබීම සහ

(ඇ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයකදී හෝ ඊට සමානවූ හෝ උසස්වූ විභාගයකදී හෝ පහත සඳහන් විෂයයන්ගෙන් දෙකකට නොඅඩු ගණනකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම : කෘෂිකර්මය, ජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, රසායන විද්‍යාව, භූගෝල විද්‍යාව, භෞතික විද්‍යාව සහ ගණිතය.

3. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයේ අධ්‍යාපන මාධ්‍යය සිංහල හෝ දෙමළ වන අතර, සිංහලෙන් හෝ දෙමළෙන් පැවැත්වෙන පාඩම් පන්ති අනුගමනය කිරීමටත්, විභාගවලට පෙනී සිටීමටත්, අපේක්ෂකයන්ට හැකි විය යුතුය. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය කුණ්ඩසාලේ පිහිටා ඇති අතර, පුහුණුව ලබන සම්පූර්ණ කාලය තුළ කුණ්ඩසාලේ, ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයීය නේවාසිකාගාරයේ නේවාසිකව ඉගෙනීමේ කටයුතු කරගෙන යාමට අනිවාර්යයෙන්ම සිදුවන බව අයදුම්කරුවන් විසින් සැලකිය යුතුය.

4. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයීය ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාව හදාරන්නවුන්ට දෙනු ලබන පුහුණුව හුදෙක්ම වෘත්තීය පුහුණුවක් පමණක් වන අතර, පුහුණුව අවසානයේදී ගොවිතැන වෘත්තියක් කොට ගැනීමට බලාපොරොත්තු වන්නාවූ සහ ඒ සඳහා සුදුසුකම් ඇත්තාවූද තරුණ, තරුණියන් උදෙසා හෝ පෞද්ගලික අංශයෙහි කෘෂිකාර්මික ව්‍යාපාරයෙහි සුදුසු රැකියා බලාපොරොත්තු වන්නවුන් උදෙසා අපේක්ෂිත පුහුණුවක් වේ.

මෙම පුහුණුවීමෙ පාඨමාලාව අවසානයේදී රජයේ කෘෂිකාර්මික ව්‍යාපාර යන්හි නිරත වීම හෝ රැකිරක්ෂා ලබා දීමට ශ්‍රී ලංකාණ්ඩුව බැඳී නොමැති බව අයදුම්කරුවන් පැහැදිලිව තේරුම් ගත යුතුය.

5. මෙහි දෙවන ඡෙදයෙහි සඳහන් අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත් ලැබුණ බව දන්වීමද නො කෙරේ.

**සටහන.**—අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබුව හොත් එහිදී පහත සඳහන් සහතික වල මුල් පිටපත් ඉදිරිපත් කිරීමටද ඔහු/ඇය සූදානම්ව සිටිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකයේ,

(ii) අධ්‍යාපන සහතිකවල (දෙවන ඡෙදය බලන්න),

(iii) අයදුම්කරු අවසාන වරට උගත් පාඨශාලාවේ ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් සහ

(iv) අයදුම්පතෙහි නම් කෙරෙන දෙදෙනාගෙන් ලබාගත් සහතික.

ඊ. අබේරත්න,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක (ව්‍යාප්ති).

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙනිය, 1973 සැප්තැම්බර් මස 1 වැනි දින.

ආදර්ශ ආකෘතිය

ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය—කුණ්ඩසාලේ

**කෘෂිකර්මය පිළිබඳව ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාවට ඇතුලත්වීම සඳහා වූ අයදුම් පත**

1. අයදුම්කරුගේ පෙළපත් නාමය (පැහැදිලි අකුරෙන්) :————.

2. වෙනත් නම :————.

3. ලිපිනය (දිස්ත්‍රික්කයද සඳහන් කරන්න) :————.

4. ස්ත්‍රී පුරුෂ භාවය :————.

5. උපන් දිනය :————.
1974 ජනවාරි මස 1 වන දිනට අවුරුදු :————. මාස :————.

6. පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන භාෂා මාධ්‍යය :————.

7. අයදුම්කරු අවසාන වරට පෙනී සිටි විභාගය :
විභාගයේ නම :————.
දිනය :————.

8. (අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී එක්වරම සමත්වූ විෂයයන් පහ හෝ ඊට වැඩි විෂයයන් ගණන (නිවේදනයේ දෙවන ඡෙදය බලන්න) :—

| | විෂය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| (i) | ............ | ............ | ............ |
| (ii) | ............ | ............ | ............ |
| (iii) | ............ | ............ | ............ |
| (iv) | ............ | ............ | ............ |
| (v) | ............ | ............ | ............ |
| (vi) | ............ | ............ | ............ |
| (vii) | ............ | ............ | ............ |
| (viii) | ............ | ............ | ............ |

(ආ) මෙහි ඉහත 8(අ) ඡෙදයෙහි සඳහන් නොකෙරෙන අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී අයදුම්කරු සමත්වී ඇති විෂයයන් :—

| | විෂය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| (i) | ............ | ............ | ............ |
| (ii) | ............ | ............ | ............ |
| (iii) | ............ | ............ | ............ |
| (iv) | ............ | ............ | ............ |
| (v) | ............ | ............ | ............ |
| (vi) | ............ | ............ | ............ |

(ඇ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ ඊට සමානවූ විභාගයකදී ලබාගත් සම්මාන සාමාර්ථයන් හෝ උසස් විභාගයකදී අයදුම්කරු සාමාර්ථයන් ලබා ඇති විෂයයන් :—

| | විභාගය | විෂය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|---|
| (i) | ............ | ............ | ............ | ............ |
| (ii) | ............ | ............ | ............ | ............ |
| (iii) | ............ | ............ | ............ | ............ |
| (iv) | ............ | ............ | ............ | ............ |

(ඈ) වෙනත් යම් අධ්‍යාපනික සුදුසුකම් ඇත්නම් ඒවා :—

9. මවගේ/පියාගේ හෝ භාරකාරයාගේ හෝ නම හා ලිපිනය :————

10. මවගේ/පියාගේ හෝ භාරකාරයාගේ රැකියාව :————.

11. පුහුණුව ලැබීමෙන් අනතුරුව වෘත්තියක් වශයෙන් ගොවිතැනෙහි නියැලීමට අයදුම්කරු බලාපොරොත්තු වන්නේ නම්, ඒ සඳහා දැනටමත් ඔහු/ඇය සතුව ඇති පහසුකම් :————.

12. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයේ පාඨමාලාවක් හැදෑරීමට අයදුම්කරුට ඇති යෝග්‍යතාවය සහතික කළ හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම හා ලිපිනයන් :

(i) ————.
(ii) ————.

මෙහි ඉහත සඳහන් කර ඇති කරුණු නිවැරදි හා සත්‍ය බව මම මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. කිසියම් කරුණක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලැබීමට පෙර හෙළිදරව් වුවහොත්, මා ඊට නුසුදුස්සකු වන බවත්, එවැනි හෙළිදරව් වීමක් පාඨමාලාව සඳහා තෝරාගැනීමෙන් අනතුරුව සිදු වුවහොත්, මා හට කිසිම වන්දි ගෙවීමක් නොමැතිවම මා පාඨමාලාවෙන් නෙරපනු ලැබිය හැකි බවත් මා දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–262—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගය—1973**

රෙගුලාසි මාලාව

1. **විභාගය පවත්වන දිනය.**—ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවා ගැනීම සඳහාවූ විභාගයක් රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් විසින් කොළඹදී පවත්වනු ලැබේ.

මෙම විභාගය දෙකොටසකින් පවත්වනු ලැබේ. පළමුවන කොටස (අ) වාක්‍ය රචනාවකින්ද, (ආ) සාමාන්‍ය දැනීමේ ප්‍රශ්න පත්‍රයකින්ද (ඇ) ලෝක කටයුතු පිළිබඳ ප්‍රශ්න පත්‍රයකින්ද, (ඈ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රශ්න පත්‍රයකින්ද සමන්විත වන්නේය. එය 1973 නොවැම්බර් මස 3 වැනි දින සිට පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය වෙනස් වී නම්, එය පසුව දන්වනු ලැබේ.

දෙවන කොටස වාචික පරීක්ෂණයකින් සමන්විත වන අතර එය පවත්වනු ලබන්නේ පළමුවන කොටසේ ප්‍රතිඵල ලැබුණු පසුය. වාචික පරීක්ෂණය පවත්වන දිනයන් දන්වනු ලබන්නේ පළමුවන කොටසේ සෑම විෂයයකින්ම සෑහෙන තරම් උසස් ලකුණු තත්ත්වයක් ලබා ගන්නා අපේක්ෂකයින්ට පමණි. එකී දෙවන කොටස හෙවත් වාචික පරීක්ෂණයට කැඳවනු ලැබීමට සුදුස්සන් වීම සඳහා එකිනෙක විෂයයන්ගෙන් ලබාගත යුතු අවම ලකුණු සංඛ්‍යාව නිශ්චය කරනු ලබන්නේ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක්වූ අපේක්ෂක යින් සංඛ්‍යාවක් වාචික පරීක්ෂණය සඳහා කැඳවීමට හැකිවන පරිදිය. මෙම විභාගය කල් දැමීම අවශ්‍ය වේ යයි හෝ අවසර්‍ථානුකූලවේ යයි රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් සලකනු ලැබුව හොත් එය එසේ කිරීමේ අයිතියද රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සතුය.

2. **පුරප්පාඩු සංඛ්‍යාව.**—මෙම විභාගයේ ප්‍රතිඵල අනුව ශ්‍රී ලංකා විදේශ සේවයෙහි පුරවනු ලැබීමට බලාපොරොත්තු වන පුරප්පාඩු සංඛ්‍යාවත් එම පුරප්පාඩු පුරවනු ලබන දිනයත් රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලබනු ඇත. එසේවුවද වුවත් පොදු යහපත සඳහා අවශ්‍යවේ යයි රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් අදහස් කරනු ලැබුවහොත් මෙයින් යම්කිසි පුරප්පාඩුවක් හෝ මෙම පුරප්පාඩු සියල්ලම හෝ නොපුරවා හරිනු ලැබීමේ අයිතියද රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය තබාගනී.

3. **සේවා කොන්දේසි.**—ඉහත සඳහන් 2 වැනි ඡෙදයේ විධිවිධානවලට යටත්ව, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව තෝරාගනු ලබන අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් රාජ්‍ය සේවාවන්හි වූ පත්වීම් පාලනය කැරෙන සාමාන්‍ය කොන්දේසි මතද, ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් කර ඇති හෝ ඊට මතුවට කරනු ලැබිය හැකි වන හෝ සංශෝධනවලට යටත්ව එම ව්‍යවස්ථා සංග්‍රහයෙහි දැක්වෙන නියමයන් හා කොන්දේසි මතද, ශ්‍රී ලංකා විදේශ සේවයෙහි ආධුනිකයන් වශයෙන් පත් කරනු ලබනවා ඇත.

මෙම විභාගයේ ප්‍රතිඵල අනුව තෝරා ගනු ලබන අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් අතුරෙන් ශ්‍රී ලංකා විදේශ සේවයට පත් කරනු ලැබෙත් එක්කම ඊට කලින් රාජ්‍ය සේවයෙහි හෝ පළාත් පාලන සේවයෙහි එවකටත් විශ්‍රාම වැටුප් සහිතව පත්වීම් දරමින් සිටි අය විශ්‍රාම වැටුප් සහිත පදනම මත ශ්‍රී ලංකා විදේශ සේවයට පත් කරනු ලබන අතර, තෝරා ගනු ලබන අනිකුත් අය අර්ථසාධක අරමුදල් පදනම මත ශ්‍රී ලංකා විදේශ සේවයට පත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා විදේශ සේවයට පත් කර ගනු ලැබීමත් එක්කම ඊට කලින් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට එවකටත් දායකව සිටියේ නම්, මිස නැත්නම්, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව ශ්‍රී ලංකා විදේශ සේවයට පත් කරනු ලබන අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් කෙරෙහි වැන්දඹු සහ විශ්‍රාම අනත්දරු වැටුප් ක්‍රමය අදාල නොවනු ඇත.

4. **සුදුසුකම්.**—මෙම විභාගය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන්/අපේක්ෂිකාවන්—

(අ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකාවෙ පුරවැසියන් විය යුතුය ;

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා සිටිය යුතුය (අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් විසින් වාචික පරීක්ෂණයට පෙර ස්වකීය සහතික පත් ඉදිරිපත් කර සිටිනු ලැබීම අවශ්‍ය වනු ඇත) ;

(ඇ) 1973 සැප්තැම්බර් 14 වැනි දින වයස අවුරුදු 22 ට පැමිණ, එහෙත් අවුරුදු 30 ට නොපැමිණ සිටිය යුතුය.

සටහන.—(i) අවුරුදු 30 හෝ ඉහළ වයස් සීමාව රජයේ සේවයෙහි, පළාත් පාලන සේවයෙහි සහ රාජ්‍ය සංස්ථාවල ස්ථිර සේවකයන් සම්බන්ධයෙන් අදල නොවනු ඇත. එතෙකුදු වුවත් එම සේවකයන් 1973 සැප්තැම්බර් 14 වැනි දිනට වයස අවුරුදු 35 ට පැමිණ නොසිටිය යුතුය.

(ii) (පළාත් පාලන සේවා කොමිසමෙන් පත් කරනු ලැබූවන් හැරෙන්නට) පළාත් පාලන ආයතන, බැංකු, ණය දෙන ආයතන හා විශ්ව විද්‍යාලවල සේවකයෝද, මණ්ඩල, සංස්ථා හා රජයට සම්පූර්ණයෙන් අයිතියක් නැත්තාවූ ආයතනවල සේවකයෝද, ඉහත (i) වැනි සටහනේ සඳහන් වන වයස පිළිබඳ අනුග්‍රහය/ලැබීමට සුදුස්සෝ නොවෙති.

(ඈ) ඔවුන් රාජ්‍ය සේවයෙහි පළාත් පාලන සේවයෙහි හෝ රාජ්‍ය සංස්ථාවල මණ්ඩලය යනාදියෙහි සේවයෙහි යෙදී සිටින්නේ නම් සතුටුදායක සේවා සටහනක් තිබිය යුතුය.

රජයේ සේවයේ හෝ පළාත් පාලන සේවයේ හෝ රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා වෙනත් රජයේ ආයතනවල හෝ සිටින මොනයම් නිලධාරියෙකු නොහොත් නිලධාරිනියක් වුවද, ඔහු හෝ ඇය 1973 සැප්තැම්බර් 14 ට පූර්වාසන්න පස් අවුරුදු කාලසීමාව තුළ හෝ, 1973 සැප්තැම්බර් 4 ට පූර්වාසන්න සම්පූර්ණ සේවා කාලය අවුරුදු පහකට අඩු නම්, එකී කාලසීමාව තුළ හෝ සතුටුදායක සේවා වාර්තාවක් ලබාගෙන නැත්නම් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙක් නොවන්නේය. යම් නිලධාරියකු සතුටුදායක සේවා වාර්තාවක් ලබාගෙන ඇතැයි සළකනු ලබන්නේ අදල සේවා කාලය ඇතුළත ඔහු හෝ ඇය තමන්ට හිමි පඩි වැඩිවීම් සියල්ලක්ම ලබාගෙන ඇත්නම් පමණි. මීට අමතරව ඔහු හෝ ඇය එකී කාලය තුළ අවවාද හැර මොනයම් විධියේ වුවද විනයානුකූල දඬුවමකට භාජනය කරනු නොලැබ සිටිය යුතුය.

1973 සැප්තැම්බර් 14 ට පූර්වාසන්න පස් අවුරුදු කාලසීමාවට පෙර මුළුමනින්ම සතුටුදායක නොවූ සේවා වාර්තාවක් ඇති නිලධාරියකු මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සකු වන නමුදු ඔහු හෝ ඇය විසින් විඳිනු ලැබ ඇති මොනයම් විනයානුකූල දඬුවමක් හෝ ඔහු හෝ ඇය විසින් ලබාගෙන ඇති මොනයම් අසතුටුදායක සටහනක්, දෙසක් හෝ අවවාදයක් වාචික පරීක්ෂණයෙහිදී ලකුණු ප්‍රදානය කරන විට සැලකිල්ලට භාජනය කරනු ලබනවා ඇත.

5. **විභාගය සඳහාවූ ගාස්තු.**—විභාගය සඳහාවූ ගාස්තු මෙසේය :—

(අ) i වන කොටස—ලිඛිත පරීක්ෂණය රු. 125 කි. එම මුදල ඉල්ලුම් පත්‍ර භාරගන්නා අන්තිම දිනයට කලින් 6 වැනි අය භාර ශීර්ෂයේ 2 වෙනි උප ශීර්ෂයේ (5) විෂයයට බැර කොට ළඟම පිහිටි කච්චේරියට හෝ කොළඹ මහා භාණ්ඩාගාරයට හෝ ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා කච්චේරියෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් හෝ ලබාගත් කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රයට ඇලවිය යුතුය.

(ආ) ii වන කොටස—වාචික පරීක්ෂණය රු. 75 කි: ගාස්තු ගෙවිය යුතු පිළිවෙල වාචික පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන ආධුනිකයන්ට පසුව දැනුම් දෙනු ඇත.

**සටහන.—කවර හේතුවක් නිසා හෝ විභාගයෙන් ඉල්ලා අස්වන, නැතහොත් විභාගයට පෙනී නොසිටින හෝ විභාගයට පෙනී සිටීමෙන් පසුව එසේ පෙනී සිටීමට නුසුදුසුයයි හෙළිවන අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට ස්වකීය විභාග ගාස්තු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබාගැනීමේ අයිතියක් නැත.**

6. **වෛද්‍ය පරීක්ෂණය.**—අපේක්ෂකයන් විසින් තම තමන් සෞඛ්‍ය තත්ත්වයෙන් හා චරිත ශුද්ධියෙන් විධිමත් පරිදි සුදුසුකම් ලබා ඇති බවට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සෑහීමට පත් කරනු ලැබිය යුතුය. ඔවුහු මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයෙන් හා මනා ඇස් පෙනුමින්ද ලෝකයෙහි කවර ප්‍රදේශයක වුව සේවයෙහි යෙදීමට යෝග්‍ය තරම් කාය ශක්තියෙන්ද යුක්ත විය යුත්තාහුය. මෙම කරුණු ගැන පරීක්ෂා කරනු ලැබීම සඳහා පැවැත්වෙන දැඩි වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටින ලෙස තෝරා ගනු ලබන අපේක්ෂකයන්ට/අපේක්ෂිකාවන්ට නියම කරනු ලබනවා ඇත.

මෙම වෛද්‍ය පරීක්ෂණය සඳහා රු. 10.50ක ගාස්තුවක් අය කරනු ලැබේ. මේ ගාස්තුව ගෙවිය යුතු අන්දම ගැන පත්වීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් වෙත පසුව දන්වා සිටිනු ලැබේ.

7. **ඉල්ලුම් කළ යුතු අන්දම.**—(අ) අපේක්ෂකයන් මීට ඈඳා ඇති ආකෘති පත්‍රයට අනුකූලව 1/2 ප්‍රමාණයේ ෆුල්ස් කැප් කොළයක තම අයදුම් පත ඉදිරිපත් කළ යුතුය. කොළයේ දෙපැත්ත භාවිතා කළ යුතුය. අපේක්ෂකයා මෙම විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම අයදුම් පතද පිරවිය යුතුය.

(ආ) විභාගයට ඇතුළත් කරගැනීම සඳහාවූ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 1973 ඔක්තෝබර් 6 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, තැ.පෙ. 1503, විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය සේවයෙහි නියුක්ත වූවන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන්ද, පළාත් පාලන සේවයෙහි නියුක්ත සේවකයන්ගේ ඉල්ලුම් පත්‍ර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ මාර්ගයෙන්ද, රාජ්‍ය සංස්ථා ආදියේ සේවයෙහි නියුක්ත වූවන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය ආයතනවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන්ද ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතු අතර, ඒවා ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් වෙත ලැබිය යුතුද වන්නේය. ඉල්ලුම් පත්‍ර සෑම අතින්ම සම්පූර්ණව තිබෙන බවට දෙපාර්තමේන්තුවල හා අනෙකුත් ආයතනවල ප්‍රධානීන් සෑහීමට පත්විය යුතු අතර, ඔවුන් විසින් ඉල්ලුම් පත් ආකෘති පත්‍රයෙහිවූ සහතිකය අත්සන් කරනු ලැබිය යුතුද වන්නේය.

(ඇ) ඉල්ලුම් පත්‍ර සෑම ආකාරයකින්ම සම්පූර්ණ විය යුතුය. ඉල්ලා ඇති සියලුම තොරතුරු සපයනු ලැබ නැති කිසියම් ඉල්ලුම් පත්‍රයක් වෙතොත් එහි සඳහන් තොරතුරු අනුව තීරණය කොට ප්‍රතික්ෂේප කර සිටිනු ලැබීමට ඉඩ තිබේ.

(ඈ) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු ලැබීමට නොපිළිවන. අන්තිම දින කීපය තෙක් ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අවාසිය විඳ දරා ගැනීමට ඉල්ලුම්කරුවන්ටම සිදුවනවා ඇත.

8. **විභාගයට ඇතුළත් කරගැනීම.**—(i) ඉල්ලුම් පත්‍ර පිළිගනු ලැබූ සියලුම අපේක්ෂක/අපේක්ෂිකාවන් වෙත විභාග කොමසාරිස් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් තමන්ගේ ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථාන පරිපාලක වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

සියළු විභාගාපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මෙම දැන්වීම අග පළ කොට ඇත. ඔවුන් විසින් මෙම නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

(ii) තමන්ට නියම කරනු ලැබූ විභාග ශාලාවේදී අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාගයට පෙනී සිටිය යුතුය. අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට නියම කරනු ලැබූ මධ්‍යස්ථානයේ හැර වෙනත් මධ්‍යස්ථානයකදී විභාගයට පෙනී සිටීමට කිසිම අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට අවසර දෙනු නොලැබේ. විභාගයට පෙනී සිටින හැම අපේක්ෂකයෙකුම/අපේක්ෂිකාවකම, විභාගය පැවැත්වෙන පළමු දිනයේදීම ඔහුගේ/ඇයගේ ප්‍රවේශ පත්‍රය විභාග ශාලා පරිපාලක වෙත භාර දිය යුතුය. සියලුම අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මෙම නිවේදනය අග පළ කොට ඇත. එම නීති පිළිපැදීමට අපේක්ෂක/අපේක්ෂිකාවෝ බැඳී සිටිති.

(iii) කිසියම් අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට යටත් පිරිසෙයින් විභාගය පවත්වන දිනට සත් දිනකට කලින්වත් තම ප්‍රවේශ පත්‍රය නොලැබුණ හොත්, ඔහු/ඇය විසින් පහත දැක්වෙන විස්තර සමග " කොළඹ 2, තැ.පෙ. 1503, විභාග කොමසාරිස් " යන ලිපිනයට (විදුලි පණිවුඩ ලිපිනය " විභාග ", කොළඹ) ඒ බව වහාම දන්වා එවිය යුතුය.

(අ) විභාගයේ නම :————.

(ආ) අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ සම්පූර්ණ නම :————.

(ඇ) ලිපිනය :————.

(ඈ) ඉල්ලුම් පත්‍රය තැපැල් කළ දිනය :————.

(ඉ) ලියාපදිංචි කළ අංකය හා තැපැල් කාර්යාලය :————.

**(iv) අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවක විභාගයට ඇතුළත් කරගැනීම ඊට ඔහුගේ/ඇයගේ ඇති යෝග්‍යතාවය පිළිගැනීමක් නොවේ. කෙසේ වුවද, විභාග කොමසාරිස් හට ස්වකීය අභිමතය පරිදි කිසියම් අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවකට තාවකාලිකව විභාගයට පෙනී සිටීමට අවසර දිය හැකිය. එසේ දෙනු ලබන අපේක්ෂකත්වය පසුව ස්ථිර කරනු ලැබේ. නැතහොත් අවලංගු කරනු ලැබේ.**

9. **හැඳින්වීමේ පත්‍ර.**—අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින හැම විෂයයක් පාසාම, විභාග පරිපාලකගේ සෑහීමට පත්විය හැකි පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ:—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රයක්,

(ආ) මේ විභාග දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදෙස් ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්),

(ඇ) විභාග දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක්ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක්,

(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ උඩු කය ඡායාරූපයක් (ඉල්ලුම්කරුගේ අත්සන එහි පසු පිටේ යොදන ලදුව එම අත්සන සහ පසු පිටේ ඡායාරූපය ඉල්ලුම්කරුගේම බව දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියකු විසින් හෝ සහතික කර තිබිය යුතුය. සහතික කරන්නාගේ නම, පදවිය, ලිපිනය හා දිනයද එහි සඳහන්ව තිබිය යුතුය. මෙම ඡායාරූප පිටපත විභාග ශාලාධිපති විසින් රඳවා ගන්නවා ඇත.

(ඉ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රයක්.

10. **අසත්‍ය තොරතුරු සැපයීම ගැන කෙරෙන දඬුවම.**—මෙම විභාගයේ රෙගුලාසි අනුව, කිසියම් අපේක්ෂකයකු/අපේක්ෂිකාවක ඊට පෙනී සිටීමට තරම් සුදුසුකම් නැති බව පෙනී ගියහොත්, විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවකදී වුවද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවක විසින් දැන දැනම අසත්‍ය තොරතුරක් සපයා ඇති බවත් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් ඔහු/ඇ සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ.

11. මේ රෙගුලාසි මගින් විධිවිධාන සැලසී නොමැති කිසියම් කරුණක් වේ නම් ඒ පිළිබඳව රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අභිමතය පරිදි ක්‍රියා කරනු ලබනවා ඇත.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ 1,
ජනරජ ගොඩනැගිල්ල,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවා ගැනීමේ විභාගය—1973

සූචි අංක :————.
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

1. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
(ii) මුලකුරුවලින් ඇඟවෙන නම :————.

2. සම්පූර්ණ ලිපිනය :————.

(රාජ්‍ය/පළාත් පාලන/රාජ්‍ය සංස්ථා/මණ්ඩලීය සේවාවන්හි සිටින අය තමන්ගේ කාර්යාලීය ලිපිනය සඳහන් කළ යුතුය.)

3. තමා ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වූයේ පරම්පරාවෙන්ද නැතහොත් ලියාපදිංචි වීමෙන්ද යන වග සඳහන් කරන්න :————.

4. (i) උපන් දිනය :————.
(ii) 1973 සැප්තැම්බර් 14 වන දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

5. (i) රාජ්‍ය/පළාත් පාලන/රාජ්‍ය සංස්ථා/මණ්ඩලීය සේවයෙහි දැනට දරන තනතුර :————.
(ii) පත්වීම් ලැබූ දිනය :————.

(රාජ්‍යපළාත් පාලන/රාජ්‍ය සංස්ථා/මණ්ඩලීය සේවයන්හි සිටින අය විසින් පුරවනු ලැබීම සඳහාය.)

6. ස්ත්‍රී පුරුෂ භාවය :————.

7. විභාගයට පෙනී සිටින මාධ්‍යය* :————.

8. (i) උපාධිය ලබාගත් වර්ෂය :————.
(ii) විශ්ව විද්‍යාලය :————.
(iii) විෂයයන් :————.
(iv) පන්තිය (ගෞරව) :————.
(v) ඉහළ/පහළ :————.

9. විදේශ සේවයට බඳවාගනු ලැබීම සඳහා වෙනත් විභාගයනටද ඉදිරිපත්වී ඇත්නම්—

(i) වාර ගණනත්,

(ii) එම විභාගය පැවැත්වූ වර්ෂත්
සඳහන් කරන්න.

10. මුදල් ගෙවූ කුවිතාන්සිය අඩකින් නොගැලවෙන පරිදි මෙහි අලවන්න. (මුදල් ගෙවූ බවට ලත් කුවිතාන්සිය, නොගැලවෙන පරිදි එහි අයිනක ලාටු ගා මෙහි අලවන්න.)

11. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතිකය :—
.........යෙහි.........වශයෙන් මම රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවක/පළාත් පාලන සේවයෙහි/මාණ්ඩලික සේවයෙහි ස්ථිර තනතුරක් දරමි.

(අ) 1973 සැප්තැම්බර් 14 දිනට පූර්වාසන්න 5 අවුරුදු කාලය තුළ රාජ්‍ය/පළාත් පාලන/රාජ්‍ය සංස්ථා/මණ්ඩලීය සේවයේ යෙදී සිටියදී හෝ (ආ) † 1973 සැප්තැම්බර් 14 දිනට පූර්වාසන්න ......... වර්ෂ තුළදී විනයානුකූල ආකාරයේ කිසිදු දඬුවමකට මා යටත් කරනු ලැබ නැති බව ප්‍රකාශ කරමි.

මගේ දැනීමත් විශ්වාසයත් ප්‍රකාර මෙම ආකෘති පත්‍රයෙහි දී ඇති තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරන අතර විභාග ගාස්තු වශයෙන් .........දින හා අංක.........දරණ කුවිතාන්සියද මීට අමුණා ඇත. විභාග පාලනය වන නීතිරීතිවලින් හා මෙම විභාගයේ රෙගුලාසි අනුව මා නුසුදුසුයයි පෙනී ගියහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම සඳහා විභාගයට පෙර හෝ විභාගය පවත්නා කාලය තුළදී හෝ ඊටපසුව හෝ ගනු ලබන යම්කිසි තීරණයකින්ද බැඳිනු ලැබීමට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

* අයදුම්කරු විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම මෙම අයදුම්පත පිරවිය යුතුය.

විභාගය ගන්නා භාෂා මාධ්‍යය වශයෙන් අයදුම්පතෙහි සඳහන් කර ඇති භාෂා මාධ්‍යය පිළිබඳව මොනයම් වෙනසක් හෝ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව කිරීමට ඉඩ දෙනු නොලැබේ.

† (අ) 5 වසරක් හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්ට අදාල වේ.

(ආ) 5 වසරක සේවා කාලයක් අඩු නිලධාරීන්ට අදාල වේ.

දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ සහතිකය :—

රාජ්‍ය/රාජ්‍ය සංස්ථා/පළාත් පාලන/මණ්ඩල සේවයේ නියුක්ත අපේක්ෂක අපේක්ෂිකාවන් පිළිබඳ සහතිකය

.........මහතා/මහත්මිය/මෙනෙවිය/රාජ්‍ය/පළාත් පාලන/රාජ්‍ය සංස්ථා/මණ්ඩල සේවයෙහි නියුක්තව සිටිමින් 1973 සැප්තැම්බර් 14 වැනි දිනට පූර්වාසන්නයන්වූ පස් අවුරුදු කාලය තුළ 1973 සැප්තැම්බර් 14 වැනි දිනට පූර්වාසන්නයන්වූ පස් අවුරුද්දකට අඩුවූ මුළු සේවා කාලය තුළ ඔහුගේ/ඇයගේ වෛකනාධික සියල්ලම උපයාගෙන ඇති බවත්, ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකුල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවත් මම සහතික කරමි.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි 4 සහ 8 යන කොටුවල සපයා ඇති තොරතුරු වාර්තා හා සංසන්දනය කොට පරීක්ෂා කළ බවත්, ඒවා නිවැරදි බවත්; අපේක්ෂකයා/අපේක්ෂිකාව මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් කවුරුවත් මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ හෝ
ඔහු විසින් බලය පවරන ලද නිලධාරියාගේ අත්සන.

නම :————.

දිනය :————.

පදවි නාමය : ————.

ස්ථානය :————.

අංකය : 1/83/33 (ජී).

**රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වැනි සහ II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)—1973 නොවැම්බර්**

1972.5.19 දින අංක 15,011 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ලඝුලේඛක සේවය පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ සඳහන් රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලනය යටතේ පවත්නා රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ I වැනි සහ II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග 1973 නොවැම්බර් මස 03 වැනි දින සිට කොළඹදී පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාග සම්බන්ධයෙන් 1973 මාර්තු මස 2 වැනි දින දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි අංක 117 කෙරෙහි විභාගාපේක්ෂකයන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

2. මෙම විභාග, විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන අතර ඔහු විසින් විභාග පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීති රීතිවලට විභාගාපේක්ෂකයන් යටත් වේ. විභාගාපේක්ෂකයන් සඳහා වූ නීති රීති මෙම නිවේදනය අවසානයේ වෙනම පළ කර ඇත.

3. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රයක් මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම් පත්‍රය අනුව අපේක්ෂකයන් විසින් ස්වකීය අයදුම් පත්‍ර පිළියෙල කර ගත යුතුය. අයදුම් පත්‍රය පිළියෙල කළ යුත්තේ බාග ප්‍රමාණයේ පුල්ස්කැප් කඩදාසියක මිස අන් කිසිම ප්‍රමාණයක කඩදාසියක නොවේ. මේ සඳහා එක කඩදාසියක් පමණක් පාවිච්චි කළ යුතුය. අයදුම් පත්‍රය ටයිප් කර පිළියෙල කර ගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අපේක්ෂකයාගේම අත් අකුරින් පිරවිය යුතුය. 1973 සැප්තැම්බර් මස 25 වැනි දින හෝ එයට පෙර, කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි අයදුම් පත්‍ර අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. අයදුම් පත්‍ර විභාග කොමසාරිස් වෙත ඉදිරිපත් කෙරෙන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්‍ය සඳහා නව ප්‍රවේශක නිලධාරීහු ඔවුන්ගේ අයදුම් පත්‍ර රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කොට, එම භාෂාවෙන් පිරවිය යුතුය. කෙසේ වුවද ආදි ප්‍රවේශක නිලධාරීන්ට ස්වකීය කැමැත්ත පරිදි රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගත් භාෂා මාධ්‍යය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ තමන්ගේ අයදුම් පත්‍ර පිළියෙල කිරීමට හා පිරවීමට හැක.

4. අයදුම් පත් පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් විසින් විභාග කාල සටහනේ පිටපතකුත් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. යම්කිසි විභාග අපේක්ෂකයකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකටවත් පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණ හොත්, ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව පහත සඳහන් විස්තරත් සමග කොළඹ, තැ. පෙ. 1503, කොම්පඤ්ඤවීදියේ මැලේ වීදියේ විභාග කොමසාරිස් (විදුලි පණිවුඩ ලිපිනය : "විභාග"—, කොළඹ) වෙත අප්‍රමාදව ලියා දැන්විය යුතුය :—

(1) විභාගයේ නම :————.
(2) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(3) සම්පූර්ණ ලිපිනය :————.
(4) තැපැල් කාර්‍යාලය, ලියාපදිංචි කළ අංකය සහ යැවූ දිනය : ————.

5. **හැඳින්වීමේ පත්.—**

**අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී, තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම, විභාග ශාලාධික්ෂකට ඒත්තු යන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ :—**

(අ) **සෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හැඳින්වීමේ පත්‍රිකාවක් ;**

(ආ) **විභාගය පටන් ගන්නා දිනට අවුරුදු තුනකට වඩා පැරණි නොවූ පාස්පෝට් බලපත්‍රයක් ;**

(ඇ) විභාගය පටන් ගන්නා දිනයට අවුරුදු තුනකට වඩා ඉහත නොවූ දිනයක ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක නියමය පිට නිකුත් කරනු ලැබුවාවූ ද, අයදුම්කරුගේ ඡායාරූපය දරන්නාවූ ද, බලපත්‍රයක් හෝ සහතික පත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක් ;

(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ උඩුකය ඡායාරූපයක් (අයදුම්කරුගේ අත්සන එහි පසු පිටේ යොදා එම අත්සන සහ පසු පිටේ ඡායාරූපය අයදුම්කරුගේම බව දෙපාර්තමේන්තු ප්‍රධානයා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියෙකු සහතික කළ යුතුය. සහතික කරන්නාගේ නම, පදවිය, ලිපිනය හා දිනය එහි සඳහන් කළ යුතුය. මෙම ඡායාරූප පිටපත විභාග ශාලාධික්ෂක විසින් රඳවා ගන්නවා ඇත.)

(ඉ) පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රයක් ;

6. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අයකිරීමට තීරණය කර ඇත :—

(අ) පළමු වතාව සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන් පසු එක් එක් වතාවල, සම්පූර්ණ විභාගය සඳහා රු. 15.00
එක් විෂයකට රු. 7.50

අපේක්ෂකයන් විසින් අත්සන් තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 අගෝස්තු මස 31 දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ දී ය.

අයදුම්පතේ ආදර්ශ ආකෘති පත්‍රය

**රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වන සහ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ඇතුළත්වීමේ අයදුම් පත—1973 නොවැම්බර්**

විභාග අංකය :————

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

1. ඉල්ලුම්කරුගේ අගට යෙදෙන නම මුලකුරු සමග :————.
(මහතා/මහත්මිය/මෙනෙවිය) (පැහැදිලි අකුරෙන්)

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :————.

3. කාර්යාලයේ හෝ දෙපාර්තමේන්තුවේ නම සහ කාර්යාලයීය ලිපිනය :————.

4. රජයේ ලඝුලේඛක සේවයට ඇතුළු වූ දිනය :————.

5. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා ඔබ ආදි ප්‍රවේශකයෙක් ද? නව ප්‍රවේශකයෙක් ද?————.

6. මීට ඉහත පැවැත්වූ විභාගයකදී ලඝුලේඛනය සහ යතුරු ලේඛනය හෝ සිංහල/දෙමළ යන විෂයයන්ගෙන් ඔබ සමත් වූයෙහි ද? එසේ නම් පැවැත්වූ දිනය සඳහන් කරන්න : ————.

7. අංකය ජී. (31) සහ 1964.9.9 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ විධිවිධාන ප්‍රකාර සිංහල විෂයයෙන් ඔබ නිදහස් කරන ලද්දේ නම් එසේ නිදහස් කරමින් එවන ලද ලිපියේ යොමුව සඳහන් කරන්න :————.

8. ඔබ පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාගය (I හෝ II) ඒ පරීක්ෂණයේ විෂයයන් හා මාධ්‍ය සඳහන් කරන්න :————.

9. මෙවර ඔබ පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාගය* (I හෝ II) සඳහා මීට පෙර ඔබ පෙනී සිටියේ ද? එසේ නම් ඒ කවදාද?

10. ඉහත 9 වෙනි ඡේදයේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා මීට පෙර මම පෙනී සිටියෙමි. මෙම ඉල්ලුම් පත්‍රයට අලවන ලද මුද්දර ම විසින් අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද ඒවා බව ප්‍රකාශ කරමි.

————,
විභාගාපේක්ෂකයාගේ අත්සන.

| මුද්දර කොටුව |
|---|

දිනය :————.

* අදාළ නොවන වචන කපා හරින්න.

ම විසින් ඉහත දක්වන ලද විස්තර සත්‍ය බැව් සහතික කරමි. මේ විභාගයේ රෙගුලාසි පිළිපැදීමට මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

අංකය : 1/83/32(ජී)

**රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයින්ගේ II වන කාර්‍යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (සම්මේලන වාර්තා කිරීම–ඉංග්‍රීසි) 1973**

රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයින්ගේ II වන කාර්‍යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති දිනවලදී පවත්වනු ලැබූ සම්මේලන වාර්තා කිරීමේ (ඉංග්‍රීසි) පරීක්ෂණයේදී පහත නම් සඳහන් ලඝු ලේඛක/ලේඛිකාවන් සමත්වී ඇති බව මෙයින් දනුම් දෙමි. වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 5,736 ට පෙරවූ කාර්‍යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කිරීම සඳහා නියමිත පරීක්ෂණය මෙම නිලධාරීන් සම්පූර්ණ කර තිබේ.

| නම | | දෙපාර්තමේන්තුව | විභාගය පවත්වන ලද දිනය |
|---|---|---|---|
| ද සිල්වා, එන්. කේ. | ... | දේශීය ආදායම්, උතුරු කොළඹ | 1973.05.11 |
| ජේසුදසන්, වී. එම්. | ... | මන්නාරම කච්චේරිය | එම |
| පෙරේරා, ජේ.වී. | ... | කම්කරු විනිශ්චය සභාව, කොළඹ 3 | එම |
| සිවසුබ්‍රමනියම්, එස්. පී. | ... | පුත්තලම දිස්ත්‍රික් උසාවිය | 1973.05.11 |
| සිඩින්, එස්. එන්. | ... | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ | එම |
| ෂන්මුගම්, කේ. එස්. | ... | යාපනය කච්චේරිය ... | 1973.05.14 |
| වාමදේවන්, ජේ. එම්. | ... | මහා භාණ්ඩාගාරය ... | එම |
| වික්‍රමසිංහ, ඩී. | ... | රාජ්‍ය පරිපාලන ... | එම |
| විමලරත්න, එච්. | ... | සමාජ සේවා ... | එම |
| මඩකුඹුර, ඩබ්ලිව්. පී. | ... | මාතර දිස්ත්‍රික් උසාවිය ... | එම |

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේදී ය.

9–282/2—72.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

අංකය : 1/83/32(ජී)

**රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ I වැනි කාර්‍යක්ෂමතා කඩඉම් (සිංහල) විභාගය—1973 මැයි**

අංක 134(ජී) හා 1966 ඔක්තෝබර් මස 23 වැනි දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ සහ අංක 117 හා 1973 මාර්තු මස 02 වැනි දින දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපියේ දක්වෙන පරිපාටියේ ප්‍රකාර 1973 මැයි මස 19 වැනි දින පවත්වන ලද රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයින්ගේ වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 4,584ක් වීමට පෙර ඇති I වැනි කාර්‍යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් පහත නම් සඳහන් ලඝු ලේඛක/ලේඛිකාවන් සමත්වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| ඉන්ද්‍රලතා, පී. ජී. | ... | රාජ්‍ය පරිපාලන |
| විමලාවතී, කේ. ඈම්. | ... | ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යාංශය |

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේදිය.

9–282/3—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

අංකය : 1/83/32 (ජී)

**රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ I වැනි කාර්යක්ෂමතා කඩඉම් (ඉංග්‍රීසි) විභාගය—1973 මැයි**

අංක 134 (ජී) හා 1966 ඔක්තෝබර් මස 23 වැනි දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ සහ අංක 117 හා 1973 මාර්තු මස 02 වැනි දින දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපියේ දක්වෙන පරිපාටියේ ප්‍රකාර 1973 මැයි මස 19 වැනි දින පවත්වන ලද රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයින්ගේ වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 4,584 ක් වීමට පෙර ඇති I වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් පහත නම් සඳහන් ලඝුලේඛක/ලේඛිකාවන් සමත්වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| අමිත්, එස්. ඒ. ... | ... | කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය |
| ජෝර්ජ්, ඊ. අයි. | ... | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| කොඩිකාර, ඩබ්. එස්. | ... | නීතිපති දෙපාර්තමේන්තුව |
| සොලමන්ස්, එම්. අයි. ආර්. | ... | කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය |

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 අගෝස්තු මස 31 දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේදී ය.

9–282/4—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

අංකය : 1/83/32 (ජී)

**රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ II වැනි කාර්යක්ෂමතා කඩඉම් (සිංහල) විභාගය—1973 මැයි**

අංක 134 (ජී) හා 1966 ඔක්තෝබර් මස 23 වැනි දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ සහ අංක 170 (ජී) හා 1968 පෙබරවාරි මස 7 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ හා අංක 117 හා 1973 මාර්තු මස 02 වැනි දින දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපියේ දක්වෙන පරිපාටියේ ප්‍රකාර 1973 මැයි මස 19 වෙනි දින පවත්වන ලද රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයින්ගේ වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 5,736 ක් වීමට පෙර ඇති II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී පහත නම් සඳහන් ලඝුලේඛක/ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් වී ඇති විෂයයෙන් පමණක් සමත්වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | දෙපාර්තමේන්තුව | | විෂයය |
|---|---|---|---|---|
| සුබසිංහ, එස්. | ... | සංස්කෘතික | ... | ලඝුලේඛනය හා ටයිප්ගැසීම |
| ජයවර්ධන, එන්. පී. | | ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යාංශය | | එම |
| පෙරේරා, එන්. එන්. | | විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය | | ලඝු ලේඛනය හා ටයිප් ගැසීම |
| ප්‍රේමවතී, ඩබ්. ඒ. ඩී. | | දේශීය ආදායම් | ... | එම |
| විජේකෝන්, එස්. | ... | මහනුවර මහේස්ත්‍රාත් උසාවිය | | එම |
| විජේසේන, ඩී. | ... | අධ්‍යාපන අමාත්‍යාංශය | ... | එම |

2. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කරගැනීමට සුදුසුකම් ලබා ඇති ඉහත නම් සඳහන් අපේක්ෂක/අපේක්ෂිකාවන් ද මෙයට පෙර සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ද මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුලු කරගැනීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියාපදිංචි කල තැපැලෙන් යැවෙන ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුය.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 අගෝස්තු මස 31 දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේදී ය.

9–282/5—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

අංකය : 1/83/32 (ජී)

**රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ II වැනි කාර්යක්ෂමතා කඩඉම් (ඉංග්‍රීසි) විභාගය—1973 මැයි**

අංක 134 (ජී) හා 1966 ඔක්තෝබර් මස 23 වැනි දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ සහ අංක 170 (ජී) හා 1968 පෙබරවාරි මස 07 වෙනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ හා අංක 117 හා 1973 මාර්තු මස 02 වැනි දින දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපියේ දක්වෙන පරිපාටියේ ප්‍රකාර 1973 මැයි මස 19 වැනි දින පවත්වන ලද රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයින්ගේ වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 5,736 ක් වීමට පෙර ඇති II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී පහත නම් සඳහන් ලඝු ලේඛක/ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් වී ඇති විෂයයෙන් පමණක් සමත් වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | දෙපාර්තමේන්තුව | විෂයය |
|---|---|---|
| දහනායක, ජේ. ජේ. එම්. | පොලිස් ... ... | ලඝුලේඛනය හා ටයිප්ගැසීම |
| ප්‍රනාන්දු, ඩී. එම්. ... | දේශීය ආදායම් ... | එම |

2. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කරගැනීමට සුදුසුකම් ලබා ඇති ඉහත නම් සඳහන් අපේක්ෂක/අපේක්ෂිකාවන් ද මෙයට පෙර සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ද මීලඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුලුකර ගැනීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියාපදිංචි කළ තැපැලෙන් යැවෙන ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුය.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 අගෝස්තු මස 31 දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේදී ය.

9-282/6—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### නිවැරදි කිරීමයි

1973 අගෝස්තු 31 දින අංක 75 දරණ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ IIඅ ඡේදයේ අංක 1110 දරන පිටුවේ පළවී ඇති ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ වේරහැර ලංකා-ජර්මානු අභ්‍යාස විද්‍යාලයට ආධුනිකයන් ඇතුලත් කර ගැනීම නිවේදනයේ 2 වෙනි ඡේදයේ (ආ) කොටසෙහි සඳහන් "දෙවකට" යන්න "දෙවරකට" යනුවෙන් ද, 5 වෙනි ඡේදයේ "ප්‍රධාන නිලධාරි තැන" යන්න ප්‍රධාන ගිණුම් නිලධාරි තැන යනුවෙන් ද සංශෝධනය විය යුතුය.

9-325—1973.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළු දෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

උපලේඛනය

1973

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... 73.07.25 | බදාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... 73.08.01 | බදාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... 73.08.08 | බදාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... 73.08.15 | බදාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... 73.08.22 | බදාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... 73.08.29 | බදාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... 73.09.05 | බදාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... 73.09.11 | අඟහරුවාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... 73.09.19 | බදාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.